
# සංකල්පනා

පද්‍ය

නිර්මාණ සංග්‍රහය



නුවිනි හෙසාරා බටුකුමාර

# සංකල්පනා

## පද්‍ය සංග්‍රහය

පළමු මුද්‍රණය : 2025

ISBN 978-624-9348-0-4

කතෘ ප්‍රකාශනයකි

**නුවිනි හෙසාරා බටුකුමාර**

**බ/සීවලී මහා විද්‍යාලය**

**(11 ශ්‍රේණිය)**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදුන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හොරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කර්තෘ සටහන

මාගේ කුළුදුල් පද්‍ය සංග්‍රහය වන සංකල්පනා නම් ප්‍රකාශනය සමාජය හා බැඳුණු විවිධ මාතෘකා පදනම් කරගෙන නිර්මාණය වී ඇත. මෙහි ලියූ පදවැල් ඇසුරින් පාඨක ඔබ සිතහි යම් අරුත්බර සිතිවිල්ලක් රඳවන්නට අපේක්ෂා කළෙමි.

මෙම නිර්මාණය ආරම්භ කළ දා පටන් මා දිරිමත් කළ ආදරණීය අම්මාත්, තාත්තාත්, නංගීත් මෙන්ම මාගේ හොඳම මිතුරාත්, පොතක් ලියන්නැයි උනන්දු කළ සිරිමාන්න ගුරුතුමියත්, මාලනි ගුරුතුමියත්, පුෂ්පා ගුරුතුමියත්, ඉරෝෂණී ගුරුතුමියත්, මයුරි ගුරුතුමියත් හා පෙරවදන ලියාදුන් නිශ්ශංක ගුරුතුමාත්, අප සීවලී නවෝද්‍යා මහා විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමන් ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලයත් මා හට ශිල්ප ලබාදුන් ගුරුමව්වරුන්, ගුරු පියවරුන්, පාසලේ සංගීත අංශයත්, නන් අයුරින් සහය දුන් සහෝදර සහෝදරියන් ඉතා ගෞරවාදරයෙන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

පොතක් ලෙස මුද්‍රණය කිරීමටත් ප්‍රකාශ කිරීමටත් ඉමහත් උපකාරයක් කළා වූ වත්සලා ගුරුතුමියත්, Silver Line මුද්‍රණාලයටත්, සූ ඇඩ්වර්ටයිසින් ආයතනයටත් මින් මාගේ හදපිරි ප්‍රණාමය පුද කරමි.

මෙම ග්‍රන්ථයේ හිමිකම් කර්තෘ සතුවන අතර මෙහි එන කිසිවක් අනවසරයෙන් උපුටාගැනීම අනුමත නොකරමි.

නුවිනි හෙසාරා බටුකුමාර

අංක 272,
ඉහළ කහත්තේවෙල,
බණ්ඩාරවෙල.
bnhesara2008@gmail.com

# පෙරවදන

කවිය නම් හද බසයි. හදවතට අමතන්න පුලුවන් භාෂාවයි. කවිය සොඳුරුය. කවි රස දන්නා දැනෙවනා හදවත් ද සොඳුරුය. ''පෙදෙහි රසහව් විඳුනා දෙනෙතා ඉතා දුලබෝ'' ලෙසින් දැක්වෙන්නේ කවියෙහි රස සාරය උරාගන්නට සමත් හදවත් ඉතා දුර්ලභ බවයි. යම් අයෙක් අතින් නිමැවුණු කවියක එය ඒ අයුරින්ම විඳගන්නට හැකිවන්නා සහෘදයා වන්නේ එබැවිනි. සහෘද වූ හදවත් ඇතියෙකු විසින්ම ය කවියේ රසය උරාගන්නේ, දරාගන්නේ. කවියෙහි රසයෙහි ආස්වාදය ලබන්නා බ්‍රහ්මාස්වාදය ලබන්නේ යැයි පෙරදිග විචාරකයෝ දක්වති. එසේ හෙයින් කවිය මහා බ්‍රහ්මයාගෙන් මිනිසා ලද දායාදයක් යැයි ද කියති. මහා බ්‍රහ්මයාට සමීපවීම ඉතා දුෂ්කර කාර්යයකි. එසේ හෙයින් සහෘදයින් ඉතා දුර්ලභ වනුයේ. අතීතයේ සිටම කවියා ලෙස අප හඳුනාගෙන තිබෙන කලාව කෙබඳුද ? එම කලාව අඛණ්ඩව ඒ අයුරින්ම පැවතුනාද ? නොඑසේ නම් වෙනස් වුණාද ? එසේ නම් ඒ කෙසේද ? කවියේ නූතන විග්‍රහ මොනවාද? මෙහිදී අප විග්‍රහ කර බැලීම සුදුසු යැයි මම සිතමි. විශේෂයෙන්ම සීගිරි කුරුටු ගී දෙස බැලිමේදී එක්තරා යුගයකදී අපේ රටේ කාව්‍යමය නිර්මාණ පරිසරය සකස් වූ අයුරු හඳුනාගැනීමට පුලුවන. එය වඩාත් හඳුනාගැනීමට මෙම සීගිරි කුරුටු ගීය අප කියවා බලමු.

*''බෙයදහි රන්වනුන් මෙන්*
*නොබැනැ සිටි මල ගෙනැ අතින්*
*මෙදිගැස් තමන් නොබෙදන ජු''*
*අර්ථය - බියපත් වූවා මෙන් රන්වන් ලියෝ*
*නොබැන බෙයදට වී සිටිති.*
*තමන් කතා කරන නමුදු*
*මේ දිගැසිය නම් අතින් මලක් ගෙන සිටින්නී ය.*

තවත් සීගිරි කවියක්.........

*''අගනිති අන් සලව් මෙහි*
*පොහොන් කෙත් නැති ද*
*නව බග් ළසන්දී දුටි මිනිසෙක් හු නොවජන්නේ යි.''*
*අර්ථය*
*'කතුනි මේ ගීය වටිනා එකක්*
*සේ සලකන කෙනෙක් නැත්තේද ?*
*බක් මස නව ළසඳ දුට අයකු*
*ප්‍රතික්ෂේප නොකටයුත්තේ ය.'*

ඒ සීගිරි කවි යුගයේ අපේ කවියේ වර්ණය යි. හැඩයයි. එය යුගයකට සුවිශේෂී ය. ඒ සුවිශේෂී වර්ණය හැඩය තුළ හෘදයාංගමය වූ හැඩයක් නැත්තේ යැයි පැවසිය හැකිද ? එසේ පැවසිය හැක්කේ කෙසේද ? මහාවංශඨීකාව හෙවත් මහාවංශටිඨත්තපප්පකාසිනිය ලියැවෙන යුගය කවියෙහි හා සාහිත්‍යමය යුගයේ වෙනසක් වී ඇති බව පෙනේ. උදාහරණ ලෙස,

''චත්තාලීස සහස්සේසු - නරේහි පරිවාරෙත්වා
නා නා තුරිය සංඝුඨියෝ - දේවරාජ විලාසනාවාස''

මහාවංශටිඨත්තපප්පකාසිනෙියේ මෙසේ සඳහන් වනුයේ රුවන්වැලී මහා විහාරයේ ධාතු නිධානෝත්සවය සඳහා දුටුගැමුණු රජු පැමිණි ආකාරයයි. දේවරාජ විලාසනාවාස ලෙස උපමාවක් යෙදීමෙන් මෙම ප්‍රකාශය කාව්‍යමය හැඩයකින් ප්‍රකාශ කිරීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ. ඉන් මතු කෝට්ටේ යුගය වන විට භාරතීය ආභාෂයෙන් කව් සිළුමිණ වැනි මහා කාව්‍ය මෙන්ම සංදේශ කාව්‍ය, බුදුගුණ කාව්‍ය වැනි නිර්ණයන් තුළ සිවුපද ස්වරූපී කාව්‍ය නිර්මාණයෙහි ඇත. ඒ නිසා අපේ සාහිත්‍ය කෙතේ පැළවුණේ මෙ සිව්පද ආකාරයේ කවිය. එසේ සාහිත්‍ය කෙතේ දළුදමා රූස්ස වෙසින් වැඩෙන්නට ගත්තේ මෙම සිව්පද කවිය. සිවුපද කවිය හුදෙක්ම සැබෑම කවියක් ලෙසින් දීර්ඝ කාලයක් තිස්සේ ලාංකීය සමාජය තුළ පැලපැදියන් වනුයේ මෙහි සිංහල කවියේ කොළඹ යුගය කවිය

දක්වා අඛණ්ඩව පැවත එන මෙවන් පසුබිමක් මුල් කරගෙන ය.

*''ගොඩ මඩ දෙකම සරුසාරය    එලබරය*
*කටුරොද ගම්මානය තරමක    පිටිසරය*
*ඒ ගම මැදින් ගලනා ගඟ    මනහරය*
*කඩමණ්ඩිය පිහිටියේ ගම    කෙළවර ය''* වැනි ඉතාම සරල වූ වාර්තාමය ප්‍රකාශනයන් දක්වා සිංහල කවිය ලසුවීම සේම කවියක් විග්‍රහ කිරීමේ දී පද හතරක් තිබිය යුතු බව සිතීම එම පද හතර එළිවැට තිබුණොත් එය කවියක් ලෙස පිළිගැනීමට සූදානම් වී සිටි ලක්ෂණ ජන සමාජයේ කවිය පිළිබඳ වූ ආකල්ප මෙහි වේ. මෙම තත්වය ප්‍රකට වන ජනශ්‍රැතියේ නැත්නම් ජනප්‍රවාදයේ එන කතාවක් තිබේ. එක්තරා භික්ෂුන් වහන්සේ නමක් ධර්ම දේශනාවකට වැඩම කළ අවස්ථාවේ එක්තරා කාන්තාවක් මේ හාමුදුරුවන්ට කවියක් කියන ලෙස ඉල්ලීමක් කර ඇත. මේ අවස්ථාවේ ඒ හාමුදුරුවෝ කවියට මාතෘකාව යොදන්නේ කුමක්දැයි ඇසූ විට කාන්තාව කියා ඇත්තේ එසේ නම් ''පඩික්කම'' ගැන කවියක් කියන්න කියායි. එවිට මේ හාමුදුරුවෝ මෙහෙම කවියක් කීවාලු.

*''ඉහළට කට පහළට කට*
*මැදට ගෙඩිය පඩික්කම*
*පහළට කට ඉහළට කට*
*මැදට ගෙඩිය පඩික්කම*
*මැදට ගෙඩිය ඉහළට කට*
*පහළට කට පඩික්කම*
*මැදට ගෙඩිය පහළට කට*
*ඉහළට කට පඩික්කම''* කියා කවියක් ගායනා කළේය.

ඉදින් මේ පඩික්කමේ ස්වරූපය ප්‍රකාශවන විදිහ, අර කාව්‍ය අගමුල මාරු කරමින් ගායනා කරපු අවස්ථාවක්, මෙවැනි දේ පවා කවිය ලෙස පිළිගැනීමට පෙළඹුනේ සීපද ආකෘතිය කවිය යැයි වටහාගැනීම තුළ බව අපට පෙනේ.

සිංහල කවිය නිසඳැස් කවිය දක්වා රූපාන්තරණය වීමට බලපෑ පළමු කවියා ජේ.බී. සේනානායකයන් බව බොහෝ දෙනා පිළිගනී. නිසඳැස් කවිය බෙහෙවින් බටහිර කවියට සමාන වන්නා වූ කවියකි. නිසඳැස් කවිය ක්‍රමයෙන් සමාජගතවන විට ඊට විරුද්ධව විවිධ විචාරණ විවේචන පැන නැගුනු බවද කිව යුතුය. කතා කරන බසෙහි වැකිවල අගමුල මාරුකරදීමක් ලෙස නිසඳැස් කවිය හැඳින්වූ ඇතැම් විචාරකයින් කිසිඳු ශබ්ද හෝ අර්ථ රසයක් නැතැයි ප්‍රකාශ කරන නමුත් බටහිර කවියා පෙරදිග කවියට වඩා වෙනස්වන අතර එහි අර්ථ රසය බෙහෙවින් ගැබ්ව ඇත. නිසඳැස් කවිය පිළිබඳ අධ්‍යයනය කිරිමේදී ජේ.බී. සේනානායක, ගුණදාස අමරසේකර, පරාක්‍රම කොඩිතුවක්කු, සිරි ගුණසිංහ මෙන්ම රුවන් බන්දුජීව, කුමාර හෙට්ටිආරච්චි, මහින්ද ප්‍රසාද් මස්ඉඹුල වැනි බොහෝ කවීන්ගේ නිර්මාණ අධ්‍යයනය කිරීමෙන් එහි රසය පිළිබඳ අවබෝධ කරගත හැකිය.

එසේ හමුවන කවියක් විමසා බලමු. පියංකාර බන්දුල ජයවීරගේ ''අලුත් ලොක්කා පරණවීම'' නම් කවිය මේ ආකාරයෙන් දැක්වේ.

*''......අප පරක්කු වී හැමවිටම වැඩට එන විට*
*නුඹ වේලාවට ඇවිත් තිබුණා*
*අත්සන් පොතේ රතු ඉරක් පායා තිබුණා*
*කලක් ගත වුණා*
*අපට නුඹත් නුඹට අපත්*
*හෙමින් පුරුදු වුණා*
*අප වගේම නුඹත්*
*හෙමින් පරණ වුණා*
*වෙලාවට වැඩට ආව නුඹ*
*පරක්කු වී වැඩට එන්න හෙමින් පුරුදු වුණා*
*ගෙදර වැඩක් ඇති දවසට*

*කන්තෝරුව අමතක කර නුඹ ගෙදර නැවතුණා*
*නූලට අකුරට නීතිය රකින බව*
*මුලින් මුලින් පෙන්නුව නුඹ*
*කල් නොයවා නුඹත් අපෙත්*
*වෙනසක් නැති බවම පෙන්නුවා*
*පරමාදර්ශී වූ නුඹ අපි වගේම*
*අඟ හිඟ අඩු පාඩු සහිත*
*පුහුදුන් මිනිසෙක් බව ඉතින් පෙන්නුවා''*

එය නිසඳැස් ආර අනුගමනය කරමින් ලියවුණු කවියක්. නමුදු මෙහි අර්ථ රසයත් ශබ්ද රසයත් ගැබ් වී ඇති බව අපට පෙනේ.
එසේම කුමාර හෙට්ටිආරච්චි කවියාගේ කවියක් විමසා බලමු. මෙය හඳුන්වා ඇත්තේ ''ඔබේ ආදරය සහ මගේ කවි'' යන මාතෘකාව යටතෙයි.

*''....අතීතය මවාගෙන ඔබ ගෙදර යනවා දුටිමි*
*අනාගත තරු එළිය ක්ෂීරපතයට වැටුණි*
*ආදරය වඩා ගෙන ඔබ ගෙදර යනවා දුටිමි*
*ඒ නිසා ජීවිතය මගේ දෝතට වැටුණි*
*ජීවිතය දිහා ඔබ හැරී බැලුවා දුටිමි*
*ඒ නිසා ආදරය මගේ කවි උඩ වැටුණි ''*

මේ කවි දෙස බැලිමේදී නිසදැස් කවියක අර්ථය, ඒ අර්ථයෙන් ගැඹුර මනාව පැහැදිලි වේ.

නූතන ලංකාවේ කවීන් ලෙස මතු වන්නේ අල්ප වූ මිනිසුන් ප්‍රමාණයකි. කවි පොත් ලියවෙන්නේ ද අල්ප වශයෙනි. කවියක රසය දැනෙන විමර්ශනශිලී බුද්ධිමතුන් වඳ වී යන නිසා විය යුතුය. මෙසේ වනුයේ කවියෙකු විසින් කවි පටිකයක් ලියන්නේද අල්ප වශයෙනි. කවියක් කවි පොතක් දක්වා මුද්‍රණාද්වාරයෙන් එළිදැක්වුවද පිටපත් සියයකට වඩා මුද්‍රණය කිරීමට මැලිවේ. එවන් යුගයක නුවිනි

හොසාරා බටුකුමාර කාව්‍ය සංග්‍රහයක් එළිදැක්වීමට සිතීමද බෙහෙවින් අගනා හැඟීමකි. ඇගේ කවි සැබවින්ම හෘදයාංගම ද සොයා බැලිය යුතුය. සාහිත්‍ය ලොවේ උඩුගම් බලා පීනන ඇය කවියේ එම මිණි මෙවුල් පාඨක අතට අත්පත් කිරීමට දරන නිරුත්සාහික වෙහෙසට වටිනාකමක් සැපයිම අපගේ වගකීම හා යුතුකමක් වන බැවිනි.

නුවිනි හෙසාරා අඛණ්ඩව ගලායන මිනිස් ජීවිත ප්‍රවාහයක එක් දිය බිඳකි. ඇගේ පළමු කවියෙන්ම ඒ බව පසක් කෙරේ. එය නිරායාසයෙන් මතු වූ ආත්මීය ගීතයක් සේ මට පෙනේ.

*''විසිතුරු කවි කතා මැවේ*
*සිත්තම් හැඩ රටා ගෙනේ*
*සනුහරයක සිරිත් විරිත්*
*ඇසුවේ මම,*
*අත්තම්මේ හඬින් නුඹේ''*

අම්මා, තාත්තා ජීවය වුවා සේම අත්තම්මා ඇගේ සංස්කෘතික ජීවිතයේ ජීවයයි. රොමැන්ටික් ප්‍රේම සල්ලාපයක් වැළඳගත් පරපුරක් ගොඩනැගූ සමාජමය වටපිටාවක නිමැවුණු සදාකාලික ප්‍රේමයක ආත්මීය ගීතයයි මෙය. සම්ප්‍රදායික සිව්පද ගත වූ හතරැස් කවියක් නිදහස් කාව්‍ය ස්වරූපයක් අතරින් ගලායන මෙම ලියමන ඇයගේම අනන්‍ය කාව්‍ය රූපයකි. නැවත ඈ ඇඳුරුතුමන් වෙනුවෙන්ද මෙසේ ලියන්නේ......

*''පිදුවා සැමට තම දරු මෙන් ආදරය*
*කාලය ජය අරන් හුරු කළ චින්තනය*
*පිටුවක අගිස්සේ ලියැවුණු රතු හරිය*
*තුඩකින් කීය මතු දිවියක වපසරිය''*

කවියක අරුතක් රස සේම ශබ්දය රටා තුළ ඇති රස සාරයක් ඇ විසින් සොයාගෙන ඇති අයුරකි මින් ප්‍රකට වන්නේ. පිටුවක ''අගිස්සෙන් ලියැවුණු රතු හරිය - තුඩකින් කීය මතු දිවියක වපසරිය'' මේ අයුරින් නොබිඳුණු විරිතක් සහිතව හෘදයාංගම ප්‍රකාශනයක් නිමවීම සමාජමය වාසනා ගුණයකි.

කිවිඳියගේ පුරාතන කාව්‍ය පිළිබඳ අධ්‍යයනය ප්‍රශස්තය. විශේෂයෙන් භාරතීය කවි කලාව ගුරු කොටගත් සන්දේශ කාව්‍ය මෙන්ම විවිධ අක්ෂර බන්ධනයන්හි ලක්ෂණ ප්‍රකට වන අවස්ථාවන්ද ඇගේ කාව්‍ය තුළින් දැකිය හැකි වේ.

*''රොනට මලක ගුණ නැණ රැඳ*
*සුමට වචන දිය දිය ලෙද*
*ලොවට කලණ මිතුදම් මැද*
*සකල සමත සෙවණකි සොද''*

සැබවින්ම මෙම බන්ධනයෙහි ඇති කාල රිද්මය මැදුම් තනිතිතේ කඩවම් කාලය වන්නා සේම ඒ කවිය කියවන ඕනෑම පාඨකයෙකුට හිතට වගේම ඇගටම එම රිද්මය දැනේ. මා හටද එහිදී මතකයට නැගෙන්නේ සන්දේශ කාව්‍යයක දැක්වෙන

*''ඇලුම් බැලුම් කරන ලොලේ*
*කතක එරඟ රඟන රගේ*
*සවන පැළඳි නිල් උපුලේ*
*නෙතට පැරදි සෙයින් සැලේ''*

මෙම කාව්‍ය දෙකෙහිම සමාන තාවයක් පවතී. කවියක ආත්මය වන්නේ රිද්මය යැයි මම දකී. ඇලුම්, බැලුම් කරන ලොලේ සහ රොනට මලක ගුණ නැණ රැඳ එකම නිර්මාණයකින් නිර්මාණය වීම අනායාසෙන් සිදුවූ දෙයක් බව මම දනියි. මෙහි තවත් විශේෂම ලක්ෂණයක් වනුයේ එම කවියේ සියලු අක්ෂර ලඝු අක්ෂර වීමයි. එය අපූරුව පද බන්ධනයකි.

නුවිනි හෙසාරා ඇද මේ කඩතොලු සමාජයේ එන සමාජ සත්වයෙකි. ඇට ද අන් පොදු මිනිසාට ලැබෙන අත්දැකීම් ඒ අයුරින්ම ලැබේ. ජීවිතයේ අරමුණු අපේක්ෂා ඇස්පනාපිට බිඳ වැටුණු පත්‍රිකා වගන්ති පනත්වලට පමණක් හිරවූ මානව හිමිකම් අහිමි වූ හැල්ලේ දුවන හීන වලාවන් අතර අතරමං වු ජීවිතයක් හිමිවී ඇති ඇට මෙන්ම මේ සමාජයේ අනෙකුත් දරුවන්ට ඇති පොදු ප්‍රශ්න ඇගේ කවි තුළින් ප්‍රකට වේ. එහෙයින් ඈ මෙසේ කියයි.

''ක්‍රිකට් අත අල්ලන්න - පිට්ටනියේ පැන ගන්න,
දූවිල්ලේ නැවෙන්න - හවස් වරුවක් දෙන්න''

මෙම කවියෙන් ඇගේ ජීවන අත්දැකීම් මනාව ප්‍රකට කිරීම ඈ සමත්වී ඇත. ඇගේ ''හැලෙන මිණිකැට'' නම් කාව්‍ය තුළ ඇති සමහර පද්‍ය ඉතාමත් ප්‍රශංසනීය මට්ටමින් ලියැවී ඇති බව පෙනේ.

*''පොතත් එක්කම ගැටෙන*
*වෙහෙසබර මනසකට කලාවක්,*
*නිදහසක් නැති තැන ප්‍රක්ෂේපණය වෙයි,*
*මත්ද්‍රව්‍ය, මත් වතුර, සිගරෙට්ටුවක්''*

දරුවන්ගේ හුස්ම පොදටත් ලංසු තබනා මිනිසුන්ට ඈ බිඳ වට්ටන්නට හැකිවේද ? නැත. ඈ ලියන්නෙහි ය. ඇගේ මානසික ශක්තිය අපරිමිත වීරිය, ධෛර්ය මෙසේ ලියන්නේ. ඇතැම්විට ඈ ආයාසයෙන් හෝ අනායාසයෙන් ඇතැම් දෑ සඟවා කියන්නේ සමාජමය කුහකත්වය ගැන පරමාදර්ශී විය යුතු දුර්වර්ණ වු ආත්ම සහිත මිනිසුන් ගැන ඈ කියයි. නමුත් ඈ ඉතා සියුම්ව හැඟුම් වදන් තුළ සඟවා ලියන්නෙහි ය. එය කවියෙකු තුළ පවත්නා සංයමයටත් එහා ගිය අරපරිස්සමකි. බුද්ධිමය මහිමයකි.

ඇතැම් තැනක අනුප්‍රාසාත්මක ශබ්ද රසයෙන් යුක්ත පදයන් යොදාගනමින් ඈ ගීතවත් රසයකින් කවි ලියයි.

*''රිදී රිදී තාරකා නිවී නිවී ගියාදෙන්*
*හඬ හඬා මද සිනා වැටී වැටී හඬපුදෙන්*
*තල තලා හිත හිතට රව රවා බලපුදෙන්*
*වරද නුඹ කියූ පාඩම් මතකයක රැඳුනාදෙන්''*

මෙම කවිය තුළ දක්නට ඇත්තේ ඇගේ හදවත තුළ ජනිත වූ ගීතමය භාෂාවකි. ගීතමය ස්වරූපයෙහි අනුප්‍රාස රසය මුසු කාව්‍යයකි. කාව්‍යකරණයේදී ඉතා සියුම්ව බුද්ධිමත්ව ඉතා සංයමයෙන් අරපරිස්සමෙන් වචන භාවිතය හා එහි ඇති මහිමය කවියක් ලෙස එහි ඇති සුමට වදනක් යන කාව්‍ය දැක්විය හැකිය. එහි සඳහන් වන ආකාරයට....

*''ගුත්තිලව පැරදෙන්න දෑතේ සවි වැඩිවෙන්න*
*අවි දරපු මැරවරුන් ගුරු චරිතෙ නොසිටින්න....''*

සැබවින්ම එය සමාජ යථාර්ථයකි. ඈ විසින් සඟවා කියන අවස්ථාවකි.

''නිවට නොවන - ලොවට හැඟෙන
සියුම් වචන - සිත් සනහන''

වැනි රිද්මයානුකූල පද යොදාගනිමින් ඇගේ කාව්‍ය සරසා තිබේ.

ඕනෑම මිනිසෙකු ලැබිය යුතු මානසික ශක්තිය කුමක්දැයි ඈ කවිය තුළින් ප්‍රකට කරයි.

*''මිලිනව ගිය පත් සිනිඳු - දැවුණු ගිනි කඳ මැදින්*
*තටු ගහලා නැගිටින්න - ෆීනික්ස්ට නොදෙවෙනිව''*

සැබවින්ම මෙය කිවිඳිය ප්‍රකාශ කරන ඒ මානසික ශක්තියේ මහිමය යි. මිනිසුන් ආදරය කරන විවිධ වර්ණයෙන් හැඩයෙන් සුවඳින් ඒ ආදරය හැඩ කරති. කවියාද ආදරය කරයි. ඒ ආදරය අසීමාන්තිකව විශ්වයට පැතිරෙයි. බලන්න, නුවිනි කිවිඳියගේ ආදරයේ සුවඳ, එහි ඇති ගැඹුර.... සියවස් ගණනාවක් මිහිපිට ජීවත් වූ මුනිවර මිනිසෙක් විශ්වයට දක්වන ආදරය වගේමයි. ඇගේ ආදරයේ වර්ණය. එය ප්‍රකට වන සුවිශේෂී කවියක් ''නැවුම් කොළයක්''.

*''කාසියක් නෝට්ටුවක් අතට නැති*
*කුසක ගිනි කොයි වෙතත්*
*හිතක ගිනි උඩු දුවන*
*ගැලූ දා බඳු වීර්යක*
*සෝදයි සංකාව*
*දූලි වී ඇත එයම*
*මැති ඇමති පා පිස්නවල''*

සැබවින්ම මෙය සමාජයේ දුක් විඳින මිනිසුන් කෙරෙහි දක්වන ආදරය, ඇගේ කවිවලින් තිබේ. අතීතයේ සිටම කවියෙකු කවියක් තුළින් දුන් පණිවිඩය රජෙකුගේ අණබෙරයකින් දුන් පණිවිඩයට වඩා ප්‍රබලය. ගජමන් නෝනා, රංචාගොඩ ළමයා, අන්දරේ, කුම්බි ආදී අපට හමුවන සිංහල කවීන්ගේ කවි මොනතරම් ප්‍රබල වීද ?

බටහිර කවියන්ගේ කාව්‍යමය ප්‍රකාශනයෙන්ද ලෝකයේ පැවැත්මට විශාල බලපෑමක් කර ඇත. නුවිනිගේ කාව්‍ය ප්‍රකාශයන් තුළ ද එවන් ප්‍රබලතා සැඟවී ඇති තැන් බොහෝ ය. එවන් වූ ප්‍රබල ප්‍රකාශනයක් ලෙස ''බිඳ සම්මතය'' යන කවිය දක්නට පුලුවන.

*''සියපත් සිරගත නොකර*
*ආකාශයට තබා ඉඩ හසර*
*මායිම් ස්මරණය කරමු*
*පෞරුෂය රැකගනිමින්''*

මෙහි සියපත් සිරගත නොකළ අකාශයට තබා ඉඩ හසර, අතිශය ප්‍රබල වූ ප්‍රකාශයකි. නුවිනිගේ කාව්‍ය ප්‍රකාශයන් තුළ එවන් ප්‍රබලතා ඇති අවස්ථා බොහෝ ය.

කුරුසියේ පුරාවෘත්තිය නම් වූ කාව්‍යයද එසේම ප්‍රබල දාර්ශනයක් ඉදිරිපත් කරන්නා වු කාව්‍යයෝ ලෙස දැක්විය හැකිය.

ඇගේ කවිසිත දාර්ශනික ය. එය මනා බුද්ධි ප්‍රවාහයක පිළිබිඹුවකි. ඇගේ කවිසිත වාසනා ගුණයකින් ආඪ්‍යය. ඇගේ කවිසිත අත්දැකීම වෙනස් අයුරකින් දකී. ඊටත් වෙනස්ව ලියයි. මා සිතන්නේ තව තවත් පුහුණු කළ යුතු කවි කෙතක් ඈ සන්තානයේ ඇති බවයි. අනේකවිධ කාව්‍යාකෘතීන් අනේකවිධ පරිකල්පනයන් විවිධ වූ කාව්‍ය වර්ණයන් හා හැඩයන්, අත්දැකීම් තුලින් පෝෂණය කරගත යුතු බවය. කියවීම, විඳීම, ලිවීම, පරිශිලනය, විමසීම, පිරික්සීම නිරන්තරයෙන්ම ඇගේ කාව්‍ය මගෙහි අංගයන් විය යුතුමය.

අවසන, මම මෙසේ කියමි<br>
නුවිනි හෙසාරා බටුකුමාර,<br>
කාව්‍යමය අනන්ත අවකාශයෙහි<br>
මහත් වූ පරාසයක් අත්පත් කරගනිමින්<br>
බබලන තාරකාවක් වීම මාගේ ප්‍රාර්ථනාවයි.<br>
ඒ සඳහා ඉට සිතින් සුභ පතමි.

නිශ්ශංක ගුණතිලක<br>
ගුරු උපදේශක (සංගීත)<br>
කලාප අධ්‍යාපන කාර්යාලය<br>
මහියංගණය

# පිදුම

නිතැතින් ම මා
අගය කරමින්
වැරදි හැර
නිසි මගෙහි හොවමින්
අව්‍යාජ හදවත්වලින්
මා හට,
අත්පොළසන් දුන්
මාගේ දියුණුව ම පැතූ
සියලුම දෙනාට
ඉතා ගෞරවයෙන්
තිළිණ කරමි.

# පටුන


I. ඇගයුම්

1. මව්පිය වන්දනා
2. ඇඳුරිඳුනි දයාබර
3. විඳු මව්නි
4. කලණ මිතුදම්

II සට්ටන

5. එක හවසකට
6. හැලෙන මිණිකැට
7. විනිවිදව
8. යුක්තියේ හඬ
9. වරද නිවරද
10. ලෙන බිඳින සිංහබා
11. වරම් ලද දා
12. නැවුම් කොළයක්
13. නොපිරිණු අටුව
14. කඩුල්ල
15. විරහ අවමඟුල
16. බිඳ සම්මතය
17. 1889 තරු විසුල රැය
18. එදත් අදත් හෙටත්
19. අඳුරු පැති රජස් මැද
20. පුත්‍ර කව

III ඇගයුම්

21. රුවන් මිණි හෙළ වැරුණ
22. උරුමයක් ගිලිහුණි
23. බිසෝ බිම්බා
24. තිරගත විය
25. රැයක සුමධුර
26. මූද

IV එක් දැයක්

27. සංහිඳක ලියමන්
28. අස්වැද්දුම
29. දම් ගඟුලයි මධුර
30. කුරුසියේ පුරාවෘත්තිය
31. පිච්චමල් වැල්
32. කුරාණයෙන් බිඳක්
33. දම් යදම රන් පටක්

V ධර්මතා

34. කලාවේ ධර්මතා
35. නොලදත් සරසවි ආසිරි
36. විප්ලවයින් පසු
37. සිහින සිහිනම නොවේවා
38. කාලයේ ගණුදෙනුව
39. කරලියේ දී
40. එකාවන් ය
41. න්‍යායන් නොමැතිමුත්
42. ලෝ දහම් මැද
43. වන්දනා ගමනක්ය
44. දෝලනය නොවූවෙමි
45. උපේක්ඛාවෙන්
46. මතු බලවියක

VI ප්‍රාර්ථනා

47. රිසියෙන් කව වේවා
48. දියැලි දිවි තනුව
49. බිඳෙන් බිඳ
50. බලා ඉන්නැයි
51. සුසුම් නිමාව
52. ප්‍රතිඥාවයි
53. අපේම ලෝකයක්
54. නිසැකවම
55. අවසන් පැතුම
56. පුරාවෘත්තයක්

# තේමාව


I. ඇගයුම් 19

II සට්ටන 26

III අභිමන් 41

IV එක් දැයක් 49

V ධර්මතා 59

VI ප්‍රාර්ථනා 75

# සංකල්පනා

ඇගයුම් නොලදත්
සට්ටන මධ්‍යයේ
ගැටෙමින් වැටෙමින් නැගිටිමින්
විජයග්‍රහණය ලබන දින
අභිමන් දරමින්
එකම එක දැයක් වී
රජ ජාතිය ආගම උදෙසා
ලෝ දහම් අභිමුව
රන් විමනක් වනු වස්
මිණි පහනක් වනු වස්
සංවේදීත්වය සානුකම්පාව
මනුෂ්‍යත්වය ද ගෙන
ප්‍රාර්ථනාවක් කරන්න
එවිට දැයට
සිතිවිල්ලක් ව එක්වේවා....
මෙනම් ''සංකල්පනා''.

තේමාව

# ඇගයුම්

# 01. මව්පිය වන්දනා

ලේ කිරි කර පෙව් බැවිනි
නැළැවිලි ගයා කිවිඳියක විලසිනි
සිත සනසන බසින් තෙපලමිනි
ගෙදර බුදුන් නුඹ ආදර මවුනි

කුළුණු බරැති හද මඩලෙනි
සව්සැප දුන් නිරිඳාණෙනි
උතුම් ගුණැති විරුවාණෙනි
වඳිනෙමි පා පිය රජිඳුණි

විසිතුරු කවි කතා මැවේ
ගෙත්තම් හැඩරටා ගෙනේ
සනුහරයක සිරිත් විරිත්
ඇසුවේ මම,
අත්තම්මේ හඬින් නුඹේ



## 02. ඇඳුරිඳුනි දයාබර

ඇස්වැන්නක් එල දරන්න
වෙර වීරිය ලබා දෙමින්
මා තුළ වූ නිපුණත්වය
සොයා දියුණුව පතමින්
සිසු දිවියේ පහන් ටැඹව
පැමිණි මඟ
ඔබේ ඔවදන් මුතුහර
ආලෝකමත් කර ඇත

අඹරට දිනකර වඩින සඳ පාසලට එන
බිම පැදුරක මහ මැදුරක කොහෙහෝ උගන්වන
ධනය ශ්‍රමය නොතකා දිවි කැප කරන
ඇඳුරු සඳයි අප ගනදුරු දුරු කරන

නොතේරෙන දෙයක් දෙවරක් වුව උගන්වපු
ඉගෙනුම තුළින් ඉහළට මං පෙන්වාපු
කටු අත්තක් මල් කිනිතෙන් නහවාපු
දෙවන මව්පියන් නුඹමයි ඇදුරින්දු

පිදුවා සැමට තම දරු මෙන් ආදරය
කාලය ජය අරන් හුරු කළ චින්තනය
පිටුවක අගිස්සෙන් ලියවුණු රතු හරිය
තුඬකින් කීය මතු දිවියක වපසරිය

ගුණදම් උඩුගුවනට සම වූවා
කැපකිරීම් මහමෙරකට වැඩි වූවා
දුන් දැනුමෙන් සාගරයක් පැරදුවා
සිසු දිවියක මුදුනත මල්කඩ වූවා

සිත් අපේ දැනුදු සනහා ගලන දිය පහර
නෙත් අපේ පුබුදු කළ පිපුණු මල නටු අතර
සිප් සාය සංසිදන පැන් පොදයි සිලිලාර
දිසාපාමොක් නුබයි ඇඳුරුනේ දයාබර

රැද අපේ පසුපසම කටු අකුල මල්එලින් නහවා
මැද සිතින් ලෝදහම කරුණා ගුණයෙන් ගයා
කැද ළඟට දරුපෙමින ඔවදන් මිණෙන් සරසවා
වැද ඔබේ පා පියුම් පතමි චිරංජතු කියා

පෙර අප නොදත් දෑ බොහෝ ගෙනවුත්
නෙත සිත සතුටු වන ලෙසිනි උගන්වූත්
පුදයට පිවිටු සිප් සතර පොහොසත්
වැද ගුරු දෙගුරු දක්වමු ගරු බුහුමන්



# 03. විදු මව්නි

විදුමව්නි,
සෙනෙහෙබර ආමන්ත්‍රණය යි ........
නුඹේ සෙවණට විසිවුණ
මල් කැකුළක් රැගෙන
නැණ කිරණින්ම නොව
විකසිත කර පිබිදුවේ

නුඹ තුරුලට වී
සංගීතයින්
ලදිමි ජීවිතය
පෝෂණය වූවෙමි
සාහිත්‍යයෙන්
හදවතින් මියෙනා තුරා
කෘතඥතා පවසමි

ඉඩ හසරක් වේදිකාවල
ලෝකයාගේ නෙතු අභිමුව
රැගෙන ගොස් අප සැවොම
සිසු සිසුවියන් ඔප දැමූ

නිලොභවම වෙහෙසෙනා
ළබැඳි ඇඟුරු දැහැනින්
පරව යනු ඉඩ නොතැබූ
රැකුලක් ජීවිතයකට

කුරුටු ගී පදවැල් ගෙනත්
හැඩ කරන නැණ පාදන
නුඹේ හදවතයි මව්නි
අපේ විදු පුස්තකාලය

හිතැති,
සොයුරු සොයුරියනි
සිහි තබා ''ආපදාන සෝභිනී පඤ්ඤා''
වදන නිතැරම, විදු මවින්,
දීප්තිමත් කළ යුතු ය නුඹ
කීර්තිමත් කළ යුතු ය නුඹ
විනය නැණ තුළින්
ගෙන හැර පෑ යුතුය නුඹ

සරසවි වරම් ලද
ජයටැම් ලකුණු කර
කුළුණු බර හදවතින්
පැණසර නුවණින්
තිරසර ගුණයෙන්

විශිෂ්ඨ පරපුරක්
දැයට තිළිණ කරනා
සීවලී විදු මවිනි..........

නුඹ බැබළේවා රන් වණින්
මේ පෙරදිග මුතු ඇටයේ
අභිමානනීය තේජසින්
සැරදේවා ! වොරූදේවා ! වැජඹේවා !



# 4. කලණ මිතුදම්

රොනට මලක ගුණ නැණ රැද
සුමට වචන දිය දිය ලෙද
ලොවට කලණ මිතුදම් මැද
සකල සමත සෙවණකි සොද

ගලා ගිය ගං දිය
ඉඩෝරෙක වියැළෙද්දී
මහා වැසි ඇඳ හෙලූ
මේඝය, නුඹ මිතුර

ගම් දනව් සිසාරා
මඟක පෙරටම යද්දී
මකා තනිකම මං කියූ
රන් තරුව, නුඹ මිතුර

රිදුම් වේදනා දරමින්
සතුට ළඟ තුටු කඳුලු දී
ලොව දහස් රුදු වදන් යට
පහන් ටැඹ, නුඹ මිතුර

සවියක් ව නිතැතින්
අරමුණු වෙතට දිරිදී
හදවතින් අත්පොළොසන් තැබූ
කලණ මිතුදම, නුඹ මිතුර

සොහොයුරාණෙනි,
දිනන්නට හැකි වේවා,
නුඹට ජීවිතය
සියලු පැතුම් ප්‍රාර්ථනා
සර්වප්‍රකාරයින්ම සඵල වී

# තේමාව

# සට්ටන

## 05. එක හවසකට

ක්‍රිකට් අත අල්ලන්න
පිට්ටනියෙ පැනගන්න
දූවිල්ලේ නැවෙන්න
හවස් වරුවකට දෙන්න

වයලීන් ගිටාර් ස්වර
පදවැල් එක්කරලා
ලියූ වැයූ ගැයූ ගීත
මතකයක් නොවන්නට

රෑ වෙනකම් වෙසෙන
අමතර පංතිවල
ගෙදර නැවතුණ තැනදි
නැතිව ගියෙ කලාවද

බිත්ති ටික ගොඩනැගිලි
සායමක් ඇඳි වර්ණ
සිතුවමක තෙලි තුඩක
උරුමකරුවන් කොහෙද



පන් වියපු හැඩ දමපු
මැදුරු සුර ලොව කරපු
ශාලා වේදිකාවල උන්නු
සැරසිලිකරුවන් සැඟවූ


# 06. හැලෙන මිණිකැට

යටත්වෙලා සමාජයක දෘෂ්ටි කෝණෙට
තටු කපලා නිදහස දන් දුන්නාට
විභාග තරඟ කියලා නමදුන් එයට
දුවන්නම ඕනෙද හණමිටි තාලයට

ධන තණ්හා කෙලෙස් බරින් අන්ධ ඇස්
මරා දමයි අකම්පිතව මනුෂ්‍යත්වයක්
සොබාදම විශ්වය හා පමුණා උදහස්
කාලය නැති තැන තිබේදෝ සැනසුම්

දළඹුවෝ වී දුක් විඳිමුත් හෙටට ජය පතන්
ගසන මඩ පහරටයි අප ඉවසිය යුතු
තටුවලට වෙඩි තියන් සිහින මැකී ගියත්
පියැඹිය හැකි නොවෙද අරමුණක් පසුපසින්

කලා රස පාගා දමයි මතු දින ගැන බියෙන්
යකඩින් මල් හදයි සංවේග හෙළා දමමින්
හදවත් නැතිව රුදු රකුසු දැයකට මුල පුරන්
කරුමෙය කියා නම දෙයි නොදැනුවත් කමින්



ගණිත කුල්ලෙන් හැලෙන මිණිකැට
ඔබ දමන්නට අපොහොසත් වත්මන
බැඳී ඇත කුඩුවක වටකොට
සැහැල්ලු ව සැනසීම අවමකොට

පොතත් එක්කම ගැටෙන
වෙහෙසබර මනසකට
කලාවක් නිදහසක් නැති තැන
ප්‍රක්ෂේපනය වෙයි ! මත් ද්‍රව්‍ය, මත් වතුර, සිගරෙට්ටුවක්''

# 07. විනිවිදව

කිරි සුවඳ යන්නට මත්තෙන් වීදියක
මල් පොහොට්ටුවකි විසිවුණ සුදුරෝස
කවුරුත් ළඟක නැති කොහෙවත් පිටගේක
රැකුමට සියුමැලි අමතක විය ලෝකයට

උණුහුම සොයන පෙති දිදුලන එතැන
දුක්මුහු ගීය ඇසුමට තිබ්බානම් සවන
බාලවියක නොලදත් රැකවරණයේ රැහැන
විදු මවකට වූවද දෙන්නට හැකි නොවෙද

පිනිබිඳු උහුලනු බැරි තැන මලට
දිවරස පින ගිය එහි නැවතී කුමට
රැවටී ගොසින් පරමිතු පවුරකට
කම්නැත නැගිට හෙටලොව දිනනු මැන

කුසුමක වෙන්න මත්තෙන් මිලිනවුණු
වගකිව යුත්තෝ මල නොව ගස් ළඟ උන්නු
තිබුවා නම් ඉඩක් ඇයි එහි කනගාටු
චෝදනාව මලට නොව අකුලට මල රැකපු

සමහරක් සුදු රෝස පිපි තැනම පරවුණා
ඇස් පනාවේ රතු රෝස මල් පිබිදුණා
දැයෙ අමන බැල්මකින් නෙත් අගිසි තෙත්වුණා
සම්මතය බිඳි නමුත් මාවතක් ලොප් වූණා

දරුදුක නැතිව මල් පොහොට්ටු විසිවෙද්දි
රැකුමක් නැතිව රැල්ලට ගහගෙන යත්දී
තනියක් ඇතුව හරි ජීවිතෙ පරදිද්දි
සිරගෙය පරක්කුයි කතාව දැන ගද්දි

# 08. යුක්තියේ හඬ

පොලිස් කාර්යාලේ පැත්තක බංකුවක
චූදිතයා නොවී වැටිලා ඉන්න කොට
සැකපිට කියලා පොතේ අගකොනක
ලියවුණදා ඇත්ත, කොහොම පෙන්වන්ද ?

විෂම වු මේ යුගයක්
ගැටි වැටි උන් සමාජයක්
මහන්තත්තකම් උහුලන
දුගී දනට දුක් කැන්දන



ශෝකාකුලමුත් වපසරිය
මිදෙන්නට මින් කෙලෙස
මඟක් වේ නම් එයයි
යුක්තියේ කඩතුරා හැරීම

සත්‍ය අසත්‍ය අතර
ආන්දෝලනාත්මක වූ
අනේකවිධ හිරිහැර
මැඩලන්නට නම් හැකිවේ
හෘද සාක්ෂිය ගෙනවිත්

ඇසින් දැක වරදකරු අත්අඩංගුවෙ ලෑම
කනින් ඇසු තොරතුරක මුලාවට ඇද යෑම
අල්ලසට වහ වැටී කුමන්ත්‍රණ පැසසුමට
ඇත්ත බොරු සනාත නොකරගෙන
තේරෙයිද,
ඇතීනා, උබේ ඇහැ කඩතුරින් වැහුනහම ?

# 09. වරද නිවරද

රිදි රිදී තාරකා නිවි නිවී ගියාදෙන්
හඬ හඬා මද සිනා වැටි වැටී හඬපුදෙන්
තල තලා හිත හිතට රව රවා බලපුදෙන්
වරද නුබ කියූ පාඩම් මතකයේ රැදුනදෙන්

දේදුන්නත් පාට පාටින් සිත්තම් කෙරූ
ගෑ පාටකින් කාගෙ කාගෙත් වැරදි සැගවුණු
සාවද්‍ය හඩ හඬින් නික්මිලා නොගියපු
නිරවද්‍ය විනිවිදව අරුමයෙකි නොපෙනුණු

රස විඳුමක් නැති කලුගල් හදවත්
හැමදින රිදි රිදී මිය යයි
කලාව උපදින කරුණා දයාව
කුරිරුකමින් පණ ගිලිහෙයි
දියුණුව ලුහු බැද දුවනා වේගය
අමනදමින් රජ කරනු පෙනෙයි
නොසන්සුන්ව එහි කිරුලු තකාගෙන
එකෙකු මරා උන්මත නැගිටියි

බලවී යුක්තිය !
චූදිතයා සැම විටම වින්දිතයෙකු
නොවන්නා සේ ම
වින්දිතයා ද සැම විටම චූදිතයෙකු
නොවේ.....



# 10. ලෙන බිඳින සිංහබා

පුංචි හිත් රිදුණහම
ඇඩුවා මිස ඇඬුණා නොව
වරක් දෙවරක් පහර කෑමුත්
ඇතුළතින් රැකවල් ය

ලෝකයට පේන්නට පෞරුෂය නොබිඳින්න
කේලමක පැතිරිල්ල ආත්මය නොසිඳින්න
විවේචනයට ලක්ව එපා හිත පාරන්න
ලෙන බිඳින සිංහබා හරි හෙමින් නවතන්න
මෘදු වදනකට හැකිය යෞවනය රැකගන්න

ගුත්තිල පැරදෙන්න දෑත් සවි වැඩි වෙන්න
අවි දරපු මැරවරුන් ගුරු චරිතෙ නොසිටින්න
නමගත්තු මුදලකට ඇගයුමක් නොලබන්න
තනතුරක් නොලද්දත් දරු සෙනේ රැකගන්න
ඇඳුරු ගුණ දැහැනක් ඕනි විදුමවක් සරසන්න

නිවට නොවන
ලොවට හැගෙන
සියුම් වචන
සිත් සනහන

# 11. වරම් ලද දා

කිරිල්ලියකව නැඟී කූඩුවට
පියාපත් දවා හලු කොට
ආත්මෙන් වැළපී හැඬූ
සුසුම් වැල් එක්ටැම් ගේක

යන්න නම් හැකිය දුර
ගව් ගණන් ඉඟිල ගෙන
දුන්නොතින් පොඩි ඉඩක්
දොරටුවක අඟුල් බිඳ

දුටු මතු සිහින ගොනු
හෙමි හෙමින් එළිවෙන්න
සරසවි වරමකට කිම
පැමිණි බාධක දහස ?

මිළිනව ගිය පත් සිනිඳු
දැවුණු ගිණි කඳ මැඳින්
අලු ගහලා නැගිටින්න
ෆීනික්ස්ට නොදෙවෙනිව



# 12. නැවුම් කොළයක්

මද්දහනේ අව්වට වේළී
ගිම්හානේ රස්නෙට වියළී
නටු අතරින් අතු පතරින්
ගිලිහී වැටී මග දිගට

යන එන කාරෙකක්
වාහනයක් දෙකක්
තලා පෙලා පොඩිකර යයි
ගසින් වැටි ඒ
නැවුම් කොළයක්

කාසියක් නෝට්ටුවක් අතට නැති
කුසක ගිනි කොයි වෙතත්
හිතක ගිනි උඩු දුවන
ගැලූ දා බිඳු වීර්යක
සෝදයි සංකාව
දූලී වී ඇත එයම
මැති ඇමති පාපිස්නවල

ඔවුනටද දනය හා එක් දෙයකි
රවටා මිනිසා මිනිසාවම
ගලවා මනුෂ්‍යයත්වය
පලදා වෙස් මුහුණක්
කියමින් අනාගතය
දෙයි බලාපොරොත්තු
වාචිකව,
කා කුමක් කියුවත්
දුප්පතාය කවදත් දුගීත්වය
සංවර්ධනයක් නැත
ලබා දෙන්නේ


# 13. නොපිරුණු අටුව

යල කන්නයේ වැපිරුව
අස්වැන්න ගෙට ගන්න
ඉක්බිත්තෙන් ඇවිත්
වැසිහි හිරිකඩක් වැටුණා

දාදියේ එතීලා වගේ
හුළං වැල්වල පැටලි
සිදාදියේ කරුමෙටද මන්දා
වෙහෙසක් ඇස් මත්තෙ බිඳුණා

ලේ ටිකත් දන් දීදී
පිං අරන් ඉගිල්ලුණු
මැසි මදුරු රෑනක්ම
රැයි පැලේ දොගොඩ උන්නා

ගෙන්දගම් මහ පොළොවේ
නියගෙටත් හිඳුන්නැති ඇළෙන් ම
බොල් වෙච්ච බැත උඩට
ලුණු වතුර ඩිංගකුත් වැටුණා..



# 14. කඩුල්ල

මුතු මැණික් පාමුල
වියැකෙන ගුණදම්
තැලී පරවී යයි
මිල මුදල් ඉදිරිපිට
උතුම් ගති පැවතුම්
ආත්මය පාවා දෙයි

දිවා රැයේ ඇවිදන් යන
දස දහසක් නරසෙන් මැද
අරමුණු ගණනක් පසුපස
හඹා දුවන්නෙත් අපමය

සිහින මායිමක් නැත
ගැබ්ව හිත තුළට වන සඳ
යථාර්තවාදී සමාජය
ඝාතනය කරයි සිහිනද


ගැසු ඒ වැට කඩුලු සිද
සම්මත සංස්කෘතියක
මත ගැටීම් නොසලකා
හිත නම් අසු
අල්ලා බැද තබා
හීළෑ කරගෙන
බිඳ පැනවිය යුතුය
එනම් කඩුල්ලක්



# 15. විරහ අවමඟුල

හත් දවසේ තුන් මාසේ
අවුරුද්දෙ දානේ දී
අමු සොහොන් කනත්තක්
පාලු පාරක අද්දර

සුන්නද්දූරි වූ මාණික්‍යමය වචන
විරහවක් ඒ තරම් තියුණු
කිමැයි හෘදය ?



වාග් අසිපතින් සිදුණු
කරුණා ඇසින් මියැණු
ශෝක තනුවක් වැයුණු
හැඟීම් දැනීම් මළ ගියදා


සැබවින්ම යළිත්
පැළැවෙයිද - දලුලයිද ?
නැත,

මළගම් ගියදා කවුරුද එන්නේ
මළගම් ගිය පසු කවුරුදු දුටුවේ
මළවුන් ගැන කුමට සොයන්නේ
මළගම් යනවුන් නැවත නොඑන්නේ
යළිත් දලුලන් නැත !
යළි පැළවෙන් නැත !
බලාපොරොත්තුවේ සිතලුව,
සහෘදය;
නිෂ්ඵල නොවේද ?

# 16. බිඳ සම්මතය

ගොම්මන් කලුවරට
බැහැලා එළියට මඟට
ඇසුණා වුවත්
හයෙ කණිසම් නාද
කොළ අතු හුළඟට විසිකර
පෑගුවේ මිත්‍යාව පොළොවට
පොල්මල වනා බෙරේට නැටුවට
සෙත්-දොස් දෙකකි
ග්‍රහ මාරුවට මැදවත්
රාහුවට සැක බියෙන්
කේන්දර බැලිල්ලක්
පොල්ගෙඩි බිඳීමත්
දෙවියන්ට පිදීමත්
වෛවර්ණ චාරිත්‍ර අභියස,
අන්ධ වී ඇත ජන සමාජය
සත්‍ය පෙනුනත් නොපිලිගන්නට

සියපත් සිරගත නොකර
ආකාශයට තබා ඉඩහසර
මායිම් ස්මර්ණය කරමු
පෞරුෂය රැක ගනිමින්



# 17. 1889 - තරු විසුල රැය

නැඟ බැස නැලෙවෙන
වලා පෙළින් පෙළ
රැ සඳ මෝරන
කුටීරයකින් එහා
කවුලු දොරින් දැක
කැටිවේ මුසුවේ
සිතුවම් හදවතකට
වැන්ගෝ නම් ලත්

අඳ නොවූ ප්‍රේමිය
විනිවිදව ප්‍රේමය
වික්කේ ය සිය කන
ලැබුණි එය අතකට
දැත්....... ගණිකාවකගේ !

ධවල ඡත්‍ර ලඹදුන්
මළ මොහොතට රැස්ව
කාල වර්ණ සේයාවේ
මහසෙනඟ සුසුම්ලති
සතිස් වියක් නොදැක
තරුවිසුල රැක දැක
යුරේකා ! යුරේකා !
කඩා පාත් වුණි
වල්ගා තරුවක් !



අංගොඩ වුණත් ශිල්පීන් ඇති
පූර්විකාවේ දුක්ඛ
ප්‍රතිභාවේ අග්‍ර
ව්‍යුපත්තියේ අද්විතීය !

# 18. එදත් අදත් හෙටත්

වත්මනක පමණද
ඉතිහාසයෙද වීය
එක් අඳුරු පැතිකඩක්

තෙව් ලොව පුවල නිරිදෙකි
රාවණා නමින්
කුලපති දූ කී අයුරු ඔහු
ගැන මෙයින්

තෙද බල බැඳි සක්විති නුඹ
විරු සෙන් රජ කුලපති නුඹ
ලෝ දන නැමු කිත්මිණ නුඹ
ගඟන සැරූ පියරජු නුඹ

නෞකාවක සයුරක මම
බිලිදුන් බිලිඳිය දූ මම
සහේළි නම් සීතා මම
දඬුමොණරින් ලක ආ මම

මන්දෝදරි ගිරි හෙල් කුලුනක
එපරිද්දෙන් නුඹ මා සුරැකින
දරුදුක කැටිකර පණ නල සිඳ
රාවණා සතු පවිත්‍ර ගුණ දස

රාමායණින් සලුවක ඇස් වසාගෙන
සහේලියව රාවණාව වසන් කර
වැළලු අතීතේ විද්‍යා සැගවගෙන
හෙළයිනි සොයා නික්මෙව් යක්පුරේ වග

## 19. අඳුරු පැති රජස් මැද

තම්මැන්නාවේ විකසිත
කුසුම නුබ,
සිකිපිල් වරලසින් ගවසාගෙන වද මල්
රතුපුල් වන් මුවින් පවසාගෙන පෙම් බස්
නිලුපුල් දෙනුවනින් ඉසිලුවමුත් සූසැට මායම්
කඩුපුල් මලකි කුලයම පාවපු කුවේණියත්

අනුලාව.......

විෂ බිඳින් ඈ චෝර නාගගේ
දිවිය මුලිනුපුටා දැමූ දේවි
කුඩා තිස් රජ මායමින් වට
රජය හෙබවූ අනුලා දේවි

අතීතයේ බිසවක්ය ඈ
චපල සිත බැඳි සිවට ප්‍රේමී
මරුමුවේ දොර විවර කළ ඈ
රුවක් උකසට තැබුව දේවි

වටුක ගෙන ආ වසින් වස
එලෙසටම ගත් නිලිය බමුණෑද
සතර වසරක කතක පෙරලිය
අසිපතින් සිඳි මකලතිස් දින

එහෙත්,
*''කිලි කියා වෙන් කළ*
*යුතු නොවේ ගැහැනිය''*
- බිත්ති පුවත්පතක්

# 20. පුත්‍ර කව

අනුරපුරේ සෑ අභියස
පින් ගත් අරලියා මලක
ලියවිණ ධාසෙන් පුත් කව
පුතු දෙදෙනා සමව අරන්
රැක්කා රජු තිස්සේ
දිය මත රැගු නලකි අදත්
ඇවිත් විත්ති කිව්වේ

කස්සප මුගලන් නම් එක්
රුධිරෙන් පණ ගත්තේ
පිය කඳුලින් ඉතිරිණ
කලා වැවක බැම්මේ

නිරිඳු දමා පුත් කස්සප කොහේ සැඟවුණිදෝ
නිදන් වස්තු ලද්දේ නම් නොදී ඉන්නවාදෝ
වැවක තලාවේ ඇදගිය සෙනෙහස නොදනීදෝ
බාලවියක විදි සිය දෙව් සැප සම්පත් මදිදෝ

සීගිරි ලිය බලන් හිටියා වැව් නිල් දිය සසල වුණා
මේසලතා විලාපයක විජ්ජුලතා හද දැවුණා
අවසානෙට තිබ්බ හුස්ම වැව් බැම්මක් සසල කළා
පංචන්තර පවෙන් එකක උරුමේ කස්සප ලැබුවා

උහුලන්නට බැරි ගින්දර කස්සප තැබු පිම්මේ
පුතුන් ඇතී ලොව කොතෙකුත් මෙවන් කුරිරු හැඩයේ
දෙස රැකුමට පහල වූවත් පෙර දුන් ඔවදන්නේ
ඒ පිතුගුණ කියැවනවා කුරුටු ගීත අතරේ

තේමාව

# අභිමන්

# 21. රුවන් මිණි හෙළ වරුණ

මානව සමත්කම් සැරසූ
එසඳ සොඳුරු අවකාශය

සෙංකඩ නුවරින් මහවැලි ගලනා
දළඳා රැකවරණයි සෙත් පැදෙන්නා
බෙරහඬ රැඟුමන් නිති සැරසෙන්නා
පෙරහැර එළියයි ලක වැජඹෙන්නා

සුරවිමනක් බඳු මාළිගේ දන්ත
දිලෙයි සුදුවතින් ලක්මව් හොඹවන
කුංචනාද මැද හේවිසි නද දෙන
කිරි මුහුදත් ගෙනෙ අසිරිය නිසසල

උකටලී නොවූ පෙර නරපති බහුබල
පරදා රුපුසෙන් ඇඳි ඒ සිත්තම
දෝවේ නිර්මල බුදු රදු ප්‍රතිමය
විරුගුණ වැයෙනුයේ කැටයම් පෙලකින

මිහිකත සරසන ඇම්බැක්කේ බිම
හැඩවුණ දෙවොලකි මලිගිය දැවමය
වෙස් මුහුණත් නෙක් යක්බෙර නාදෙන
පන්දම් දිස්විය කුල පෙර සිරිතට

පද්මලතා වැල් ගොතමින් ලෙන්තුළ
ගල්කණු අතරත් වර්ණිත බුදුගුණ
දිය බිඳු නිම් නැති දෙල්ගමු වෙහෙරද
මුණි පා තඹරයි සිහිලෙන් දෝවන

නාගදීපයෙන් ලංකා පටුනින් ගැයු බැති
ගෙනමින බෝ සමිඳුන් පැතිස් නිරිඳුන්
මිහින්තලාවෙන් ලක් දස පිදුව දම්
ගඟුලකි දන සිත් සතන් නිවුව පෙර

සඳකඩ පහණක පියුමකි දිදුලන
ගල්කණු රුදවිය යුගයක තේජස
නියනින් තුඩකින් නිමකළ පිළිරුව
අව්කන සමිඳුන් ගලකිනි බිහිවුණු

සමනොල කඳුමත නළල තියා වැද
පත්තිනි සළඹක් විදෙසින් ගෙනෙමින
අඬසඳ සළකුණෙ කිරිගෙරි මකමින
පොළොන්නරුව ගරු කළේ මනුසත වෙත

මුහුදින් ඇවිදින් ගල් බැඳි කොටුවක
යුධයෙන් යටතට ගත් මිණි දහසක
හෙළ රජදරුවො එඩියෙන් රැකුමෙන
පිදුවේ සිරිලක මතු බබලන්නට

සීගිරි මැඳුරින් ලොවම වශීකර
වැව් බැද දිය රැක කුස පුරවන
පඬුවස් විජබා ගැමුණු දන නැමුණ
වෙහෙර විහාරයි හැමදෙස ඉදිකළ

අනුරපුරින් නැගි විශ්මිත නිමැවුම
පෙරදා මහිමය කොතකද ලියමින
විරු ගුණ දහසක් ඒ මත සැගවිණ
දෙදහස් වසරක කිතුගොස ඉසිලිය

# 22 . උරුමයක් ගිලිහුණි

වන රුකක බරවෙලා පිපි කුසුම්
මුදු සිහිල් නල ගෙනා පෙර උතුම්
නර කැලයි හෙල රැකි අභිමන් දහස්
පරපුරින් ආ උරුම ගිලිහුණේ අපි අතින්

හයසෙන් කුර ගැටි රණ බිම් හෙළයේ
ගජසෙන් නද කුංචනාද නොඇසේ
මනුසෙන් දළ කාසිවලට පුදදේ
රුපුසෙන් බිඳ ලූ තේජස සැඟවේ

වන දඬුපත් නොකපන අණ යටව
බිම් දඬුපත් තලයට පණ හෙලන
රුක් කඳපත් නැතිවී දිය දහර
කර දඬුපත් වයසට ගුණ කොහෙද

නැඟි සැළසුම් වනපෙත තුළ මිහිරි
ලැදි මනුකම් සතුනගෙ හද සැනහී
බැදි ගුණකම් ගසකගෙ බල වොරදී
ඇදි සිතුවම් වනයක සිරි කියතී

රැලි නඟනා විල් දිය මත රැඟුමන්
වැලි පිසිනා නළ සිඹ සඳ කැලුමන්
පැදි ලියනා සියොතුන් සත පවසන්
වැසි වසිනා ගුවනත් මිහිකත රැකගන්

# 23. බිසෝ බිම්බා

සලිත නුපුර කිකිණිය මිණි මෙවුල් නද හඬගා
අමෘතයකි අව්‍යාජ ස්වරයේ සිතක් නිවනා කතක් ඈ

නුවන් දිස්නය මුහුණත පංච කල්‍යාණියයි පෙනෙනා
දෙව්දහ නුවර රන් දෙව්ලියේ මාන්නය දූවිලි කළා ඈ

සසර කතරේ ගව්වක සඳ කිඳුරු බව ඇරඹෙනා
ශෘංගාරි එක් හෘදයේ පසුපසින් නොසැලුණු ඈ

ඇසළ පෝයේ පුන්සඳ අමාවකයම නිහඬ කරනා
අසුන් කුරගැටි නාදයේ සත් මහල් කුළුණක

සිදුහත් බෝසතුන් හිමි සඳ අභිනික්මනක එතෙරෙ යමුනා
සසැලි සිත් මැඩ හුදකලාවේ ඉකිබිඳුම් මැද තනිව ඈ

හැර යන බවම දැන දැන මගක් කර ආලෝකය මනා
ළය රිදුම් දුන් දුක් මැදිනේ කිරි සුවඳ තුරුලු කර ඈ

අපරිමිත ලෝ සතුන් නිවනු රිසි වී පතමිනා
පරිත්‍යාගයේ කැඩපතයි ප්‍රේමයේ දැහැන ඈ

දිමුතු අභරණ සැරසී නමුතු ගුණයක දැවටී
සෙවණැල්ලයි උත්තරීතර භවෙන් භවයට ඈ
බිසෝ බිම්බා...




# 24. තිරගත විය

කහපාට මල් පරව යයි හෙට
සුවඳ නැතිවට පිපෙනවා නම්
නැළවි නැළවී කවුලුවෙන් මට
අනේ ආයෙත් හිනැහුණා නම්

නිල්ල දැවටී අතු අගට වී
පොකුරු දෝතට ගන්න ඇත්නම්
අතීතේ හරි තරුණ පාටයි
කහ පාට පෙති සැලෙනවා නම්

වැලි තලාවක් රනින් වහගෙන
බිම් තලාවට වඩිනු රිසිනම්
කුමුදියේ නුඹ දවල් අහසම
සරසද්දි ඇවිදින් බලා ඉන්නම්

කැකුළු කහමල් පොකුරු තුරුලට
අරන් ගව්වක් යන්න හැකිනම්
වසත් කාලය ගෙවුණාට කම් නෑ
තිරගතයි නුඹ තිරගතයි
අවසන,
නොදුටුමුත් දැසින් ; සියැසින් ;



# 25. රැයක සුමධුර

පුන්සඳ කිරණ සුදු වණින් ගලනා
නත් තුරු රැසින් අහස් කුස දිලෙනා
රන් මද කුමුදු සේපාලිකා පිපෙනා
මන් බඳ ගනදු රැය උදා වෙන්නා

සඳ කිරණ ගඟ වතුර මත දිලෙන්නේ
සේද සලු සේ දිගට ඇදි යන්නේ
කණ මැදිරි එළි නෙක රටා ඇන්දේ
නුබ තරුකැට සේ දිලිස ඉගිලෙන්නේ

විදු බුබුලු නිම ලොව නිහඬ අඳුරේ
කලු වලාවන් වසති හඳ අහස් ගව්වේ
සොමි කිරණ හරි හෙමින් මැකී යන්නේ
තරු රටාවෝ දිලෙයි මල් පොකුරේ

පිනි මුතු අතු අගෙහි රන්දා
ගනෝගනදුර ලොවට කැන්දා
වවුලු නද නිහඬකට හඬගා
රැයක සුමධුර ලොවට සඟවා

# 26. මූද

පතඟ අවරේ රක්වතින් උදුලේ
සුදෝ සුදු නුබ හැරී ගොසිනේ
තැඹිලි සලු හැද හවස් යාමේ

අණවු නිල් දිය මතින් වැද එන
සුදෝ සුදු පෙණ රළට පෙන්වන
වෙරල මනහරයි සුළගෙ තාලේ

පොල් අතුය ලෙලෙනා නැළෙවෙනා
රටාවක් ඇඳි සිහිල් පවනේ
සුදෝ සුදු මුතු සිනිඳු පලසකි
වෙරලේ වැලිකැට දිස්වෙනා

තේමාව

# එක දැයක්

# 27. සංහිඳක ලියමන්

ඒ හෘද ස්පන්දනය.....
දෙදහස් දහනමය ;
පාස්කුවේ ගිනි පුපුරද්දී
කන් පුරා රැව් දුන්න
කතෝලික ලතෝනිය
මැද්දෙන්,
හැංගී හැංගී
මේ සිරිලක තුළම
මුස්ලිම් හදවත් පවා
කඳුලකින් තෙත්වූවේ
සහරාන් නිසා නොව
පීඩිත කිතුණුවො වෙනුවෙන් ය ;

කරුණාව දයාව එහිවිය ;
ජාතිකාභිමානය එහිවිය ;
සංහිඳියාවද එතනමය ;


නේත්‍රාභිමුව සිංහ කොඩිය බැබළෙත්
දේශාභිමානය ලොවට හඬ නගමින්
සිහල දමිළ කිතුණු හා මුස්ලිම්
සිව් කුලයම එකට එක්ව දිවිගෙවත්

ලක්දිව හැම කය තුළ දුවත්
එක්ම පැහැ එක් රුධිරයක්
භාෂා වචන එහි වෙස් වූවත්
සැගවීය එක් කරුණා දයාවක්

දනන් බොහෝ දා බිඳු කැපකරත්
දැනේ එහි සුවඳ විලවුන් සුවඳක්
සහජීවනේ ජලෝතල පැතිරී නිවෙත්
මේ බිම යුධ ගිනිත් වෙඩි හඬත්

නැවතීය දෙඩුම සිංහල අපෙ බිමක්
මව් පොළොව බැව් සැවොම පවසත්
රන් දෙරණ මගේ පින්බිම ලෙසින්
සමඟි දමින් තුටින් බැති සිතින්

එකිනෙකා අත්වැල් බැද ගතින්
නෙක් පාටින් හැඩැති මල් දමක් මෙන්
එදත් අදත් හෙටත් ලොවට පෙනෙත්
සංහිදව සාමය රජයන දැයක්



# 28. අස්වැද්දුම

දේශයක් නැංවීම වෙනුවෙන්
එකට එක්ව,
එකා වන් ව,

රත් රුධිරය දුවනා කය තුළ
වර්ණවලින් ඇයි භේද හැදුවේ
එක පාටැති එක ධජයක් යට
මන්දැයි විරුවන් විතරක් පිදුවේ

ලියලා වැඩෙනා ගොයමක මහිමෙන්
සිටුගෙදරත් කුසගිනි නිවුණා
දලුලා වැවෙනා එල දැරු කුඹුරෙන්
ගොවියගෙ මැටි ගේත් දුක් නිවුණා

දා බිඳු වේ නම් කෙතකට හෙලපු
ඒවා මල් වැසි වී ඇවිදින්
ගොවියෙක් දෙවියෙකු ලෙස පිදුවා



බස රූස වොරූදෙන
විදු නැණ නංවන
නිධානයක් මත
සිගා යදිනු කිම?

හෙළයිනි නැගිටිව්
පෙරදිග ධානයාගාරය
රන් පොළොවේ අපි
ගොඩ නගමු

# 29. දම් ගඟුලයි මධුර


දහම් දියකිනි සේල ඇඳි
නිවන් මාවෙත දොරටු හැරි
වදන් සිහිලැලි සිත් නිවි
උතුම් දම්ගුණ මෙත් පිරී

කළණ මිතුදම් බැඳී අගසව්
සිව්බඹම පෙන්වීය දිවියෙන්
සියක් පිරිපත් වැළකි නුවණින්
ලොවට දහමක අරුත් දැහැනින්

බුද්ධ පුත්‍ර උතුම් සසගණ
නිවන් පුර දුටු එහි අඟුල් මල්
ප්‍රාතිහාර්යයකි පෑව අභිමන්
ද්වේෂ ශේෂ කර දමා කුසලින්

මඟකි ඇඳි ඇඳී යන පටිසෝතගාමී
රුවකි මැකි මැකී යන ජරා ව්‍යාධි
මලකි නැවි නැවී යන පරව පොඩිවී
විලකි ඉපිද මැරෙනා ගමන නැවතූ අනුසෝතගාමී

වනස්පතියක සතුන් සතහට
වෙමින් සරණක් සසර දුක්සිඳ
ඇහැළ මල්දම් දකිත් මොක්සුව
මුනිඳු පුද දම් බෙලින් මහැඟිව



උදා වූ ඒ බුද්ධ කාලෙන්
දියුණු වුයේ මනෝ කායත්
හික්ම වූ ලෞකික සැපතත්
වැඩිය ආධ්‍යාත්මයේ සැනසුම්

# 30. කුරුසියේ පුරාවෘත්තය

මැවූ ඒ පෙර කලක මසුන් හා දිය
වඩන අටියෙන් ප්‍රේමයේ උල්පත
දෙවිඳුගේ ලොව ප්‍රබෝධයි එහි
ජේසු උපතක මිහිරි ඇරඹුම

*'' මම ලෝකයෙහි පෙනී සිටින තුරු*
*මම ලෝකයෙහි ආලෝකය වෙමි''*
*(ශුද්ධවර ජොහාන් 9:5)*

ඒව රැවටී කෑ තහනම් එලින්
තුරු හිසින් විත් උගනීය දහමක්
නොරැවටින බැතිමතුන් හදවත්
එහෙත් ජේසු පාවාදීලා අවසන්

සෝදන පා අනුගාමික පුතුන් රැයින්
පෙන්වූ හැඩයි නායකයෙකුගෙ නිහතමන්
නිම නොකළ මේ දේව මෙහෙයෙන්
නමා නික්මිය ගුහාවක රෙදි කඩක්

රිදීමුත් ගත රුධිර දහරින්
නිවූවා සිත හඩන බැතිමත්
විදි නමුත් දුක් ගැහැට දහසක්
තැබූවේ සිනහව පැමිණ නැවතත්

වැඩූ මේ දෙව් අසිරි බලයෙන්
සිදිනි සෝ දුක් ලොවට ප්‍රේමෙන්
වින්දමුත් දුක් ගැහැට අපමණ
පැතු සාමය සිතක නිතැතින්

යාතිකා මැද පල්ලියකදිම
බයිබලේ තුළ සැගව ගොස් එය
සිත මම දෙව්ඳු අතර වන්
''ස්වර්ග රාජ්‍යය ඔබ තුළම ඇත''

අල්තාරයක ඉම
ඉටිපන්දමක එළියක
පැතුම් සියයක් කළත්
වඩනු හැකිය,
''හතුරු පරපුරට ප්‍රේමයක්''



# 31. පිච්ච මල් වැල්

අඬැති සඳකින් පළන් හිසමත
ලෝක පූජිත දේව මහශිව
පාර්වතියද කාලි මැණිද
නිරූපිත කළ නොමැත භේදය

නර්ථනධාරී ප්‍රතිමුහුර්තයයි විෂ්ණු
ගෝපි ලියන් මැද වස්දඬු වැයු
සුළැඟි අගකින් පර්වත ඉසිලු
සත් බවක් ලොව මිනිස් පුදපු

දියත පතල ඒ මහිම කිතුරුස
බ්‍රහ්මගෙන් උපදීය සිවු කුල
එක්ම දේශයෙ එක්ම ධජයක
ඉගැන්වීය මනසේ පිළිවෙත

පැසෙන තෙලනා අස්වැන්න ගෙන
හිරුට කළගුණ සලකතී
පහන් පූජා ලොවම සරසා
ආලෝකයින් සැනසුම් ගෙන එතී

ත්‍රිශූලයකින් ඕම් ලකුණින්
දහස් දෙවිවරු දිලෙන ස්වර්ණින්
පිදුව පරසතු මලක සුවඳින්
පැවසි භගවත් ගීත රාවෙන්



# 32. කුරාණයෙන් බිඳක්


මරතොන්ඩි අල්ලක වෙලුණු මල්වැල්
වසයි කතකගේ ඉස පටන් දෙපතුල්
උපදින කෙලෙස් කවුළු වසමින්
කුරාණය හෙළි කෙරුව දහමක්

*''අල්ලාහ් නම් වූ ඔහු*
*පොළෝතලයෙහි කවර ජීවියෙකු වූවද*
*අත්හැර නොතිබෙන්නේය''*
(කුර්ආනය 35:45)

පල්ලියක දොර විවර කෙරුමුත්
දිනක් විවරයි එහි කතුන්ටත්
පුද දෙමින් ගත දෙවිඳුන් වෙනුවෙන්
නෝම්බියි රැකි ශුද්ධ බැතිමත්

ගැති වෙමින් දෙව් තේජසකට
සැදී මනසින් වෙමින් සන්සුන්
පැහැදෙමින් දැකිය යුතු දහමකි
මනසෙ වියොවුල් හරින අරුතින්

වගකීම් බර කරට ගන්නට
ශක්තියයි දෙව් අල්ලා පෙන්වු
අත්නොහැර දිරි වැඩු ස්වර්ගෙන්
මඟකි ආධ්‍යාත්මයෙන් දැක්වූ



# 33. දම් යදම රන් පටක්

බුද්ධ රත්නයේ සරණව
දමනය කළ මනසක
භගවත් ගීයේ අරුතින්
නිමා දැමු පීඩන
කුරුසියේ ඒ පහන්
ස්වරෙන් වැඩුණ සාමය
අල්ලා දෙවිඳුන් දැක්විය
සිත් දැහැනේ විශ්මය

දිවයිනේ සිව් කොනින් එක්වී
රැදවීය සතර අත එක්ම මනුදම්
මම ය යන මුල් චේතනාවක
නැග්ම සිත බැව් පසක් කර

තේමාව


# ධර්මතා

# 34. කලාවේ ධර්මතා

මුදුන් මුල වූ මනස් ගර්භයක
අපූර්ව ඒ සංධ්වනිය
මූලධර්මවාදී රිද්මයකට
කෙමෙන් ලෝකයේ
අර්ථය; යාථාර්ථය;
සොයන දෑ යුරු
අවබෝධ කරවයි

ප්‍රභාසංස්ලේෂණයක
වපසරියද සමඟ
රජිත කිරණ ධාරාවෙන්
උනන දියක මහිමෙන්
මල් එල දැරූ රුකක්
එකට එක්ව බැඳි
ලෝ සත සබැඳුම්
ගහකොළ ඇළදොළ
සතා සිවුපාවන්ගෙන්
ලංකෘත බව තුරුලු කර
මානවයෙකු පරිද්දෙන්
උපන්නා වූ මහත් ඇල්මකින්
උපන්නා වූ දයානු කම්පාවෙන්
සංවේගනාත්මකව
දෑස් හැර බැලිමි
විද්‍යාවත් කලාවත් සමකර

හරිත වර්ණ ඡායවන්
කහ- කොළ- රතු- දම් මල් වැල්
කැමරා කාචය හසුකර
එයින් ද කී අරුතක් වෙයි



# 35. නොලදත් සරසවි ආසිරි

සොබාදමක ලැඳියාවයි
විශ්වයේම රැකවරණයි
බිම ඇති රජස් අංශුවක පටන්
සෞරග්‍රහ තරණය කර
ගව් ගණනක් ඈතක වූව
අද අප අත පුංචි ලොවකි
විදු කිරණින් සොයා ගත්තු
නෙතු මත්තේ දකින්න හැකි

අතු පතරින් එතී දැවටි
දිවා සවස ටිං ටිං හඬ
ඇසුමට නම් ප්‍රියමනාව
රෑ දෙගොඩහරියේ
නිහැඬුම බිඳ
උලලේනෙකු තැබූ හැඬුම
හද සලිතව බිය ගන්වන
රටා රූඪ මේ විශ්වයේ
ධර්මතාවයකි නිශ්චල



මේ අප පසුකර මාවත
කලාවක් ය මුණගැසූ එක්
නොලදත් සරසවි ආසිරි
අදහන්නට තරම් වටින
සෞන්දර්යයත් විටකදි
සමාධිගත ආගමක්ය
ගිමන් නිවූ ඔසුවකි
සැහැල්ලුවට මං පාදන

# 36. විප්ලවයෙන් පසු

දේව වරම් වාදයකින්
තැබුවා වූ හුවමාරුව
ලෞකික සැපතක් පිණිසට
පුනරුදයක විප්ලවයෙන්

මා උදෙසා යැයි සිතනා
දියුණුව දියුණුව සොයමින්
ක්ෂේම භූමි පසු කර ගිය
මිරිඟුවකට ලොබ බැඳිමුත්

මෙවර ලොබ බැඳී සිත
හීනෝන්මාදයට පාත්‍රව
වෙස් පෙරළනුවස්
පුනරුත්පත්තියක් පැතුමුත්

මහිච්ඡාවෙන් ඔත්පලව
අපේක්ෂා භංගත්වය
ඩැහැගත් දී........
දරා ගැනුමට වෙහෙසකර ය

නැවතුණු ඒ ගමනේදී
මළ මුහුදේ මම නොහොත්
අවසන් කව ලියමින්
නැංගුරම් ලෑ මී හේමන්තයක
හිරු එළිය නොපෙනෙන දාක
එහෙත් අතීතය කතා කරයි අද

# 37. සිහින සිහිනම නොවේවා

කළ විට එය දැක
එකෙණෙහිම පැතුමක්
ගෙන මෙන්
හත් පෙති මලෙන්
එක පෙත්තක්
ඉටු කර දෙයි ක්ෂණයෙන්
සිතූ සිතුම්වලින් එකක්
ලස්සන වසිලිස්සා;
දුප්පත් සින්ඩරෙල්ලා;
නිදි දෙව්දුව;
හිම කුමරිය;
කී කතා සියල්ල සිහින,
සුරඟන කතා කැරලියක !
සිහින සිහිනම විය.

නොදැක ඉරබටු තරුව,
එක් ගන්ධබ්බ අවධියක
යන එන මඟ නොදැන
දුන් එක් පිළිතුරකි,
ප්‍රාර්ථනාවක් කැටිකර,
ළයෙහි හොවා,
නිශ්ශබ්දතාවය,
හෘද ස්පන්දනය පමණි
නැඟුවේ ශබ්දය,
ඉවසීම් තව තවත් ;
අසීමාන්තික දරාගැනීමකි.




# 38. කාලයේ ගණුදෙනුව

කාලයේ ගෙවීයාම
තප්පර කට්ටටත විනාඩි කට්ටට
බාධාවක් නොතබා
නිදහස් කෙරිණ

ඉදින් කාලය,
නිරපේක්ෂ වී ස්වාධීනව
සර්ව ශුභවාදීත්වයෙන්
ඉදිරියම ගලා යයි
පසුපසට නොහැරෙයි

පිළිතුරු නැති පැන සඳහා
අතරමං වන විට
සුළියක් සමඟ එන
එක්තරා කැළඹුමක
කනේරි මල් සුවදක්
ගැවසී ඇති බවක්
දැනුනද.....
වසන්තය ගෙවී හමාරය !
සැම දිනක්ම වසන්තයක්
නොවූවත්,
නැවත කෙදිනක හෝ
වසන්තය එයි
වසන්තයේ රිවි මඬලක්,
පිපී රේණු නටන මලක්,
කන්කලු කූජන ගීයක්,
ගලන ගඟක දිය දහරක්,
ග්‍රීස්මක- සරත් ඍතුවක සිසිරයක,
තිබූ තැනම
නෂ්ටාවශේෂ තියයි
''කිසිවක් සිදුවී අවසන් නොවේ ;
සියල්ල සිදුවෙමින් පවතී''




# 39. කරලියේ දී

ජීවිතයේ වේදිකාවේ
රඟන නලු නිළි කැළ අප නම්,

පරිකල්පිත පුරාවෘත්තයක
මැකී ගිය ඉතිහාසයක
ගොනු වූ මතකයක
ගෙවී යන නිමේෂයක
හෙට එන අනාගතයක
ශේෂ වුණු හීනයක
අදෘෂ්‍යමානයක් නොවී
කාලතරණයක් කළ හැකි
නොවේද,
මනෝමය රූපාන්තරණයකින්

මනස්චිත සිනමා වේදිකාවක
රංගන ශිල්පීන් වී
රචකයෙකු වී
අධ්‍යක්ෂකයෙකු වී
තිර පිටපත් වෙනස් කර
රඟ දැක්මත් වෙනස් කර
එවර රූපාවලෝකනයෙන්
මෙතුවක් වූ
සියුම් සංධිස්ථාන
කෙමෙන් ග්‍රහණය කර
මනාව හසුරුවමින්
අතීතය- වර්තමානය- අනාගතය
අතර වන බැමි
හැකිය බිඳ බිම හෙළන්න
එවිට මේ මොහොත
තත්පරයකි ;
අත්දැකීම් මාත්‍රයකි ;
අබමල් රේණුවක් වූ ;
අවකාශයට අංශුවකි ;



# 40. ඒකාවන්‍ය


එකී ගෙවුණු මාත්‍රයම
තව මොහොතකට ගැටී
මතු මොහොතක වෙලෙයි

*''තථෝනං සුඛ මංවේති*
*ඡායව අන පායිනි''*

සුඛ විහරණ විඳි මොහොතක
සඟවාගෙන වූ සොම්නස
අනාගතේටද දන් දෙයි
ස්මරණයකින් සොම්නසක්ම

පසුපස වන් සෙවණැල්ලෙන්
රෝපිත සකලවිධ පැලැටි
වඩිදිය බාදිය වෙන්කර
මුකුලිත වෙයි සමහරක්
කලාතුරකින් විකසිත වෙයි

ගුගුරන අහසට කන්දී
දළ රළ නැඟි හඬ කන්දී
මහා මේඝයට කන්දී
නදී තෙරේ රිද්මයට කන්දී
ඇසෙනා,
සියල්ල තුළ සමානවන
සමුදුරුගොස ඒකාවන්‍ය



# 41. න්‍යායන් නොමැතිමුත් .....



මුලු ලෝතලයම එකාවන්ය
ගත තුළ වන රත් රුධිරය
එක්ම පැහැය එක වගේය
ආකල්ප, වපසරිය,
චේතනා, ආශාවන් පමණක් නොව
සංකල්පනාවන්ගෙන් ද අපි
වෙනස් වීමු
අසමානතාත් සමානතාත්
සමබර කර ගනිමින්
''ආනන්දයෙන් ප්‍රඥාවට''
කලාව තුළ නික්මිය හැක

දකින වලා අවුත් ගලා
පුරවති වැව් පෙළින් පෙළ
මුහුදු වලා හැඩ කරනා
සරසති දිය රළින් රළ
වෙරල වෙලා පුලිනතලා
දිලිසති රිවි කැළින් කැළ
නොමද පමා දැක අරුතා
රිද්මෙකි හෙල් කුලින් කුළ

අතු කොල සිසාරාගෙන පිනිබිංදු වැටී
දියමත්තේ දගලන මුතුදිය කොමලී
විදුලිය උපදී ගුවනක් කරමින් නිහැඬී
තනුවකි ඊට එක්වූ  මේඝ දහර වැසී

සලමින් මිහිලිය වනලිය හැංගී
දකිමින් පත් බිම වැටී වැටී ඇහිඳී
සදමින් එල මල් දම් තුරු ගැවසී
දැක්මෙන් අටලෝ දහමයි පැවසී

# 42. ලෝ දහම් මැද

සැහැල්ලු පියාපත්
සිඹියි නිදහස් අහස
හිරු එළිය අමතකව
මහ රැයද අමතකව
තුන් යාමේ ගී ගයා
පීවත් වෙති
තරඟයක නම් නොව
තමාගේ කලාවක
තම අනන්‍යතාවයක
තමාට අවැසි පරිදි

එහි නැත,
මම මගේය යන
මමත්වය



# 43. වන්දනා ගමනක්ය

අවිය කොටගෙන
මෙත් සිතක සුවඳ
අහුලන එලයෙන්
උහුලන කුසගින්න
නිවාලන අනුනද
යද්දී තමා පසුකර
දශමයක්- අඩියක්
පියවර දහසක්
හදවතින් තුටුවී
අත්පොළසන් තබන
ලෝ දහම් මැද
නොසැලී-නොතැවී
නොසෙල්වී මධ්‍යයස්ථව
එලෙස දිවි ගමන,
කරුණා කරන එක්
වන්දනා ගමනක්ය

ගමන් මගෙ අප හමුවණ
අනේක විධ බැඳීම් මැද
මං මුලාව නොයා
සොයමින් නිවැරදි නඩයක්
ඒ නඩයත් නැති වුවහොත්
කලණ මිතුදමක් පමණක්
අත්වැල් බැඳ ගමන් කරමු
අවසන් ගමනාන්තය තෙක්



# 44. දෝලනය නොවූවෙමි

නිර්වින්දනය කළේ සිතක්
නොදැනෙනුවස් හැඟීම් - දැනීම්
රිදුණාට රිදවගන්න බැරිවෙන්න
සමාවෙන්න......
ලෝකය - සමාජය
සැළකුම් - නොසැළකුම්
බිඳී - රිඳී - වැටී - තැලී
පෙලුණු ඒ හදවතින්
දෝලනය නොවූවෙමි

කවර ශෝකයක් ද ?
කවර වේදනාවක් ද ?
කවර රිදවීමක් ද ?
දරා ගැනීම් මහමෙරක් ළඟ

කඳුලක්ව නොව
සුසුමක්ම නොව
හැඬුම් ස්වරයකුදු නොව
රිදුම් මාත්‍රාවකුදු නොව
පෙර වේදනාවන්ගේ

දැන් යළිත්,
ඇද දමා හගා යා නොහැක !
කුහක මිත්‍රත්වයකට
විරහ පෙම්කවකට
දෙදරා යන වාග්මාලාවකට
සාවද්‍ය කටවහරකට
ඉදින්, පිපිරී නිවුණු පසු
කිමද පුපුරන්නේ යළිත් ගිනිකඳු ?"



# 45. උපේක්ඛාවෙන්

බිඳුණු මිතුදම් පනාපිට
සමරුවක් පළවෙන්න
සිඳුණු විශ්වාසය එළිපිට
එපා යළි පැළවෙන්න
රැකුණු කල්‍යාණ මිතුරන්ට
හැමදාම හරියන්න
රංචුවක් නැති වුණදාට
බය නොවී තනිවෙන්න

රොත්තකට යන මේ ගමන
තනිව යනු නොහැකියිද ?
සුන්දරයි හැම තැනම
තනිව යන තරමටම
විඳින්නත් පුලුවන්ය විදවීමක් නැතුව

නොරිදවා නොරිදවී නුඹෙ
ගමන සොඳුරු කරගන්න
මහඟු උපකාරයක්
මේ මොහොතේ රැදෙන
සවිඤ්ඤාණයේ දැහැන


වැව් කඩිති පුරවගෙන
ඇද හැලුණු වැස්සක
සිහිල් පවන් රොදක්
නැවුම්ය; ප්‍රබෝධමත්ය;
මොහොතක් යළි පුබුදුවන්න

# 46. මතු බාලවියක

වියැළී යන පත්‍ර අතර
පරවෙන යෞවන සමයද
මැඳුම් වියට ඉගිලී ගොස්
සැදෑ සමය උදා කරන

හැන්දෑවේ එක් කොනකින්
බැසගිය ඒ ගිනි බෝලය
යෞවනයත් නිහඬ කරන
එක් විචිත්‍ර තිළිණයක්ය

අද්දුටු දෑ ප්‍රත්‍යයක්ෂව
පැවසුනු ඔවදම් කතාව
ගෙලලයි මතු බාලවියක
සනුහරයෙන් ත්‍යාග ලෙසට



## තේමාව

# ප්‍රාර්ථනා

# 47. රිසියෙන් කව වේවා

දිසි කුස විදී විහඟුන් ගී මධුර
නිසි ලෙස ගෙන නිවි පැතුමන් විඩාබර
ඉසිවර ලෙස ලැඳි මනුසත් සදාදර
රිසියෙන් කව වේවා සිතක පිළිසකර

සිව්බඹ විහරණ දරන්
සුවයක්ම පැතීමය
දහස් බාධා හමුව
අනුනටද මෙත් පැතීමය

මල් කිනිති අතු අඟින්
පිනි බිංදු වැටුණහම
තණ ගසුත් හැඬුවාද
දරා ගන්නට බැරුව
පිනි බිංදු උහුලගෙන
ගිනි අව්ව උහුලගෙන
කටෝරයක් උඩින්
දලුලනවා කදිමෙටම

පසු කරන් පැළ පොඩිති
තණ ගසුත් පාගගෙන
උන්නෙමෙයි කීවේ වස්
සුවපත් වේවා මිසක

ඒ චේතනාවමයි
ලොවැති සුන්දරම දෙය
සිව්බඹ විහරණ දරන්
සුවයක්ම පැතීමය
දහස් බාධා හමුව
අනුනටද මෙත් පැතීමය

# 48. දියැළි දිවි තනුව

රතුකැට ගල් පරවල සැඟවීගෙන  පැමිණ
මුතුකැට එළි බබළන හැඩ පෙණ  විසිර
නිල්කැට සිලිලාරෙකි ලොව  නිවන
මිණිකැට නෙතු උදුරන දිය  දහර

රැකගත් ළං කර සිහිනෙට  රන්දා
මසැසින් නතු කර කවියට  බන්දා
හැඟුමක් ගුලිකර දියයට  සඟවා
පැතුමක් පා කර සඳකට  කිව්වා

හැලෙනා තරු පිණි නවතනු  කෙලෙස
වැහෙනා මීදුම් පටලිනි  රැකුණ
සැලෙනා සිහිලැලි ගංදියෙ  නිවෙන
හැලෙනා ගිරිහෙල් අභිමන්  දරන

මිහිරී එලවිත් නැළවිලි  ගැයුවා
ලිහිණී ගිරවුන් අවලද  ඇසුණා
හිරුණී රන්පත් රැළි රැළි  නැඟුවා
තරුණී නවලී කළ එළි  බැස්සා

මුදු මකරන්දෙකි විලවුන් ගෙන  වැන්නේ
සුදු පෙණ කැටි වී අම රස  දුන්නේ
රුදු ගල් පරවල කැටයම්  ඇන්දේ
තුටු කඳුලින් මහ මුහුදට ආ  වැඩුවේ



# 49. බිදෙන් බිඳ...

ඒ ගසක උපන් මල
පළමුවර දැක හිරුව
පොහොට්ටුව පිබිදෙද්දි
පෙති පවා නිර්භයය


රැක ගත්ත තුරු වදුල
නොදී ඉඩ බඹරෙකුට
පිපුණ මල හරි හැඩට
ලොවක ඇස් උදුරගෙන

සිනිදු මටසිලිටු බව
සමීපය හදවතට
හෙල්මැලි රේණු විය
දස සුවඳ විහිදගෙන

දළඹුවෙකුත් එසඳ
ලං නොවී ඒ මලට
කෝෂයක් බැඳ තිබුණි
තටුවලට පණ දෙන්න

කාලයක් නිහැඩියාවත්
තටු ලැබුණි ඉක්මන්ට
ඉගිලවිත් රැකගත් මලට
පණ නලද කැපකෙරිණ

රේනුවක් වත් නොතලා
මල මතම ගැවසෙන්න
සමනලයෙක් වෙනස්
තුරු වදුලට හැගිණ



සංකල්පනා

පරව යන්නට ඉඩක්
නොතබාම රැකගන්න
එල දරන්නට මහඟු
රැකුලක්ය මල ගාව

එල දරන මේ මලින්
පෙති පවා පරව ගිය
සමනල තටු වැටිණ
එක තැනම එක දිනක

දැරූ එලයද දිලිස
සතුන් අත නොගිය
අහෝ, වෘක්ෂය ළඟයි
එයද පස්වුණෙ පොලොවට

මලක් අත්තටු වැලලුණ
එලය වළගිය එතැනද
බීජයක් දුටු ලෝකය
ගසද දිරපත් වෙද්දිය

එල දරන මේ ගස
ලොවට නොමියන දහමක
අරුත ගෙන තබා යයි
නැත කිසිවක් සිදුව අවසන්
සියල්ල සිදුවෙමින් පවතී

යළිත් පැළ වී ඇවිත්
කියයි නවකතාවක්
ගසක් පමණම නොවේ
ජීවිතේ එක් ඡේදයක්

සටහන් කව සමඟ බිහිව ආ සන්තුට්ඨිය
කැටි කර කඳුලකට
නෙත් අවිස්සක රදම්

අත්නොහළ දරාගෙන
මිහි කතමෙන් උහුල
සෝ සුසුම් පහව යන
දිනයක් ඒවි නිසැකවම

දෝරේ ගලන සතුටු කඳුලු
මැදින් පිපෙයි පරසතු මල්
අත්පොළසන් හඬ මද්දෙන්
ඉවතට නොහෙලා විදිමි
වර්තමානයේ විජයග්‍රාහී සුවඳ
අනාගතයද සුවද කරන්නට
ගෙවී යන මෙය
කටෝර ගිම්හානයක් නම්
මතු උදාවන සිසිරය උඩින්
වස්සානයක්ම උදාවේවා!''

# 50. බලා ඉන්නැයි....

මූද මූද බලන්නැයි
කවුරු කවුරු ගියැයි
මොහොතක් දකින්නැයි
තරුවක් පෙරුම් පිරුවැයි

කොරල් පර දකින්නැයි
මූදු දියෙ කිමිදෙන්නැයි
සිප්පි කටු ගේන්නැයි
දූපතේක නිධන් සොයන්නැයි
ඒ තාරකා වළල්ලකැ පාරාදීසෙටැයි

පුර සඳට යන්න අවසරයි
අමාවැකේ තරු ගනින්නැයි
දකින දහසැක් එකැක්මැයි
එකැමැ තරුවක්, සඳැක්මැයි
සඳැටැ නම් එකැ ඉරැක්මැයි

ඔයැයි මායි විතරයි
අපිටැ අපි මදැයි
දිනක් එනතෙක්
බලන් ඉන්නැයි




# 51. සුසුම් නිමාව

සංග්‍රාමෙක විරු කඳුලැල්
දෙවඟනකගෙ පෙර කඳුලැල්
එකම එක පොදියකට
ගුලි කරන්.....
එකම එක සැරයකට
එකම එක අහුරකට
මද නල මතින් පා කරමු
අහස් ගව්වක් වෙතට...


තුරුලු කර දරාගෙන
දෑතින්ම අල්ලගෙන
අස්ථිර නොවන හදවත
ස්ථිර කරගෙන තවත්

දහසක් බලාපොරොත්තු
දහස් ප්‍රාර්ථනා
දහසක් සැළසුම්
දහසක් අදිටන් මැද
රකිමි,
සදා අමරණීය විශ්වාසය
පොරොන්දුවක් ලෙසට
එකී මන්දාස්මිතියෙන්ම

ගිම්හානේ ගෙවෙනා තුරා
සිසිරයේ යනෙනා තුරා
වසන්තය හැගෙනා තුරා
මෙය, ලොවම දිනනා තුරා



# 52. ප්‍රතිඥාවයි



නොමියෙන දහම ගෙනැ
මසැසින් පෙරට විත්
සංක්‍රමණයක් කරමින්
කලු කුහරයක් දිගේ
මන්දාකිණි දකින්නෙමි
රුවලකින් නිල් දියඹේ
යාත්‍රා කරන්නෙමි
ලුණු සුවඳක් අස්සෙන්
සොයාවිත් මුතු සක් පබලු
කිරි කවඩි හෙම
එක නූලකට අමුණා
කිතුමිණක් ඔබ්බවා,
''කිරුලක් පලන්දන්නම්''

රිදී අසිපත් නැතත්
ක්‍ෂුද්‍ර ශිලා තුඩින්
රන් මුවා දිවාරෙකින්
පිය නගා එන්නම්
මානවයින්ගේ......,
''හසරැල් පුබුදනුවස් ''

බිඳුණු හිත් හෙමින් සනසන්න
රිදුණු තැන්වලින් ගලවන්න
පිරුණු හිත් තවත් පුරවන්න
සතුටු කඳුලක්ම
ඔය නෙතින්,
හොරෙන් හරි වට්ටන්න

# 53. අපේම ලෝකයක්


පලිඟුවක් දිලිසේවි
ගල්කැටත් හමුවේවි
ඕන නම් රුවනාර
සේද මාවත් නෙවෙයි
පසු කරලා යා යුත්තේ

අවැසිනම් එය
අවැසිමය මට
ලබාගන්නා තුරුම
නැත අත්හැරීමක්

ඉන්ද්‍රඛීලයයි
ලොවක් අභිමුඛයෙහි
දැයක් අභිමුඛයෙහි

ඉවසීම්, කැපවීම්
නිහඬවම සෑජුවීම්
මඟ බලාගෙන මම
ගොඩ නඟමු අපි
අපේම ලෝකයක්

එබැවින්,
අවසානය ගෙවී යන්නට මත්තෙන්
වර්තමානය වෙනස් කරගත් කල
රිදීමක් හෝ පසුතැවීමක් නැත
දැකිය හැකි,
හේතුඵලදාමයක් මිසක



# 54. නිසැකවම

වසන්තය අද නොවේ
ගිම්හානෙ මං කියන
සිසිරයෙන් පසු දිනක
තුටු කඳුලු වැගිරෙන්න

ඉඩෝරෙකින් පසුව
හැඩ කළත් මල් පොකුරු
එක් කාර්තුවක් තවත්
දරාගන්නට අවැසි

ඉඩෝරයේ පෙරහුරුව
මෙයට වේ පිටුවහල
ඉල් මහේ සඳගාව
තරු කැකුළු පූදින්න


ගලන මහ මේඝයට
අකුණු සැර ගර්ජනය
කම්නැත පැවසෙන්නෙ
වසන්තෙක කූජනය

යදමකින් බැද තබා
මිහිකතක් වී උහුල
සෝ සුසුම් පරව යන
දිනයක් ඒවි නිසැකවම

ඒ දිනේ මා එක්ක
දුරුතු පුන් පෝදාට
වසන්තෙක කවි ලියමු
වෙරලෙ වැලි තලාවක

ඉඳුවර මුහුදු දිය
මැකුවමුත් ලියුව කව
සනිටුහන් කර ගනිමු
හදවතේ එක් කොනක

සටහන් කව සමඟ
බිහිව ආ සන්තුෂ්ටීය
කැටිකර කඳුලකට
නෙත් අඟිස්සක රඳමි.



# 55. අවසන් පැතුම

දෝරෙ ගලන සතුටු කඳුලු
මැදින් පිපෙයි පරසතු මල්
අත් පොළසන් හඬ මැද්දෙන්
ඉවතට නොහෙළා විඳිමි
වර්තමානයේ විජයග්‍රාහී සුවඳ
අනාගතයද සුවද කරනට

ගෙවී යන මෙය
කටොර ගිම්හානයක් නම්
මතු උදාවන සිසිරය උඬින්
වස්සානයක්ම උදාවේවා !"



# 56. පුරාවෘත්තයක්

*''සමහරු විශිෂ්ඨව උපදී*
*සමහරු විශිෂ්ඨත්වය ලබාගනී*
*තවත් සමහරුන්ට විශිෂ්ඨත්වය*
*දමා ගසා ඇත !"*
- විලියම් ශේක්ස්පියර්

මතකේ තියා ගන්න
ඇගයුම් නොලත් ජීවිත
කඳුලු බිඳුවක් නොවේවි
සට්ටනින් සට්ටනය වන
මතක බිඳුවක් නොවේවි
හෘද සාක්ෂියේ
ගැඹුරු ධ්වනියක
නොකී සටහන් රැඳේවි
ගොඩනැඟුණේ,
ලේ දාදිය සුසුම්
උඩින් නම්,
වසන්තෙදී හැංගේවි
''පුරාවෘත්ත නොමැරේවි''

# ''සමාප්තයි''

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

# සංකල්පනා

පද්‍ය

නිර්මාණ සංග්‍රහය

ඉඩෝරයේ පෙරහුරුව
මෙයට වේ පිටිවහල
ඉල්මහේ සඳගාව
තරු කැකුලු පූදින්න

ගලන මහ මේඝයට
අකුණු සැර ගර්ජනය
කම් නැත පැවසෙනිනෙ
වසන්තෙක කූජනය

ඒ දිනේ මා එක්ක
දුරැතු පුන් පෝදාට
වසන්තෙක කවි ලියමු
වෙරලෙ වැලි තලාවක

මිල රු 400/-

නුවිනි හෙසාරා බටුකුමාර
බ/සිවලී මහා විද්‍යාලය